බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 44.

අභිධම්මපිටකයෙහි

04 වන ග්‍රන්ථය

කථාවත්ථුප්‍රකරණය

ප්‍රථම භාගය

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්

අහංගම විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති
පණ්ඩිත කෝද්දගොඩ ඤාණාලෝක
නායක ස්ථවිරයන් වහන්සේ
විසින් කරන ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

බු. ව. 2550
ක්‍රි. ව. 2006

Buddha Jayanti Tripitaka Series, Volume 44

The Fourth Book in the

Abhidhamma-Pitaka

4

KATHĀVASTUPRAKARANA (I)

With the Sinhala translation by

The Venerable Pandita Kodāgoda Nānāloka Thero

Chief High Priest of Southern Ceylon,

Principal of Vidyachandra Pirivena, Ahangama

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

<u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
<u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
<u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

"අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්ඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !
බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !
ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"
(*යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය*)

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

අභිධම්මපිටකෙ

කථාවත්ථුප්පකරණං

පඨමො භාගො

අභිධර්මපිටකයෙහි

කථාවස්තුප්‍රකරණය

ප්‍රථම භාගය

"තථාගතපපවෙදිතො භිකඛවෙ ධමමවිනයො විවටො විරොචති නො පටිචඡනෙනා"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි."

(අඞගුතතරනිකාය, තිකනිපාත - හරණ්ඩුවගග, 9 සූත්‍රය.)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 31 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:31 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

පටුන

CONTENTS

සංස්කාරක නිවේදනය	XXI
පරිවර්තක නිවේදනය	XXIII
සංක්ෂෙපනය	XXV
සඞ්කේත නිරූපණය — ABBREVIATIONS	XXXXI
පාලිහෝඩිය — PĀLI ALPHABET	XXXXII
විසයසූචි	XXXXIII
පෙළ හා පරිවර්තනය	2-579
ආහටසුත්තන්තානුක්කමණිකා	583
සඤ්ඤානාමානුක්කමණිකා	585
විසෙස-පදානුක්කමණිකා	586

සංස්කාරක නිවේදනය

අභිධර්මපිටකයෙහි පස්වන ග්‍රන්ථය වූ කථාවත්ථුප්‍රකරණයෙහි ප්‍රථමභාගය බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලාවෙහි සූසාලිස් වන ග්‍රන්ථයයි. බුද්ධජයන්ති අනුස්මරණ පිළිබඳ කර්තව්‍යසංවිධානය සඳහා ලංකාණ්ඩුවෙන් පත්කරණලද ලංකා බෞද්ධමණ්ඩලය විසින් ආරාධිත වූ අහංගම විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති, දක්ෂිණලංකාවෙහි ප්‍රධාන සඞ්ඝනායක පණ්ඩිතාචාර්ය කෝදාගොඩ ඤාණාලෝක මහාස්ථවිරයන්වහන්සේ කථාවත්ථුප්‍රකරණපාළිය සිංහල භාෂාවට නගාලූහ.

ධර්මශාස්ත්‍රයෙහි හා පාලි - සංස්කෘත - සිංහල භාෂාවිෂයෙහි නිපුණවූ "සාහිත්‍ය සරස්වතී" පණ්ඩිත ඤාණාලෝක ස්ථවිරයන්වහන්සේ, ග්‍රන්ථ-ව්‍යාඛ්‍යානයෙහි ලා පූර්වාචාර්යවරයන් ගත් මග අනුගමනය කරමින් අක්ෂර-පදව්‍යඤ්ජනසම්පත් හා ගම්භීරාර්ථ උදාවනසේ ග්‍රන්ථගෞරවයට හා සිංහල සාහිත්‍ය පෝෂණයට හිත වූ ශ්‍රැතිරම්‍ය වචනසන්නිවේශයෙන් මෙතාක් සියබසට නොපත් කථාවත්ථුප්‍රකරණය පළමුවරට සියබසට නගාලීමෙන් තමන් වහන්සේගේ නාමය ලක්දිව ශාසනවංශකථා සමග ඉතිහාසගත කළහ.

උන්වහන්සේගේ හිතමිත්‍ර සිගුණයුත් පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද නායක ස්ථවිරයන් වහන්සේ විසින් ලියා තිබෙන සංඥපනයෙන් කථාවත්ථු-ප්‍රකරණය පිළිබඳ ඉතිහාසය ද, ග්‍රන්ථතත්ත්වය හා එහි වාදමාර්ගය ද, අභිනව සිංහලපරිවර්තනයෙහි අගය ද මැනැවින් පහළ කොට ඇත.

මේ අධිකාරයෙහි අග්‍රමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක ස්ථවිරයන්වහන්සේගෙන් ද උපදෙස් ලැබී ඇත. ග්‍රන්ථය මුද්‍රණයට සකස් කිරීමෙහි දී ත්‍රිපිටකපරිවර්තනකාරකමණ්ඩලයෙහි සාමාජික කාර්යක්ෂම පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන්වහන්සේගෙන් ලැබී තිබෙන උපකාරය අතිශයින් පැසසිය යුතුය. පෙළ හා පරිවර්තනය යෙදෙන ප්‍රමාණයට සරිලනසේ කොටස් තුනකට බෙදා පරිහරණයට ද පහසුවන පරිදි මුද්‍රණය කිරීමට සම්මත වූ කථාවත්ථුප්‍රකරණයෙහි ප්‍රථමභාගය අපගේ අවසාන සංස්කරණයෙන් මෙසේ මුද්‍රණයට පමුණුවාලීම මහත් ම භාග්‍යයෙකි. මෙහි ද්විතීය භාගය ද දැනට මුද්‍රණයෙහි පවත්නේ වේ.

සංසාරදුඃඛයාගේ අනුත්පාදනිරොධය වූ නිර්වාණය සාක්ෂාත් කිරීමට බාධක වූ සත්කායදෘෂ්ටිය ප්‍රභව කොට ඇති පුද්ගලවාදය (=සචේතනික-අචේතනික හැම වස්තුවෙක්හි ම පැතිර පවත්නා ඉන්ද්‍රියවිෂය නො වූ ස්වයංභූත සර්වබලධාරී ශාශ්වත සුඛස්වරූප ආත්මයෙක් ඇතැයි මායාමෝහ-නයෙන් ගන්නා අර්ථශූන්‍ය සංකල්පය) කථාවත්ථුප්‍රකරණයෙන් ඛණ්ඩනය කොට ඇත.

මේ මිථ්‍යාසංකල්පය නිසා සත්ත්වයා සසරදුකෙහි බැඳී නිර්වාණාධිගමය නොලබන බව අවබොධ කොටගත් මහාකාරුණික බුදුරජාණන් වහන්සේ පඤ්චස්කන්ධ - ද්වාදශායතන - අෂ්ටාදශධාතු - ද්වාවිංශතීන්ද්‍රිය යන ධර්මපුඤ්ජයන්ගේ සත්පණස් අවයව ධර්මධාතු (හෙතුඵලනියාම) වශයෙන් විභාග කොට දක්වමින් **විභජ්ජවාදය** (අභිධර්මය) දෙශනාකරමින් ප්‍රාකෘතක (ලෞකික) ජනයා විසින් පඤ්චස්කන්ධාදිය සත්ත්ව, පුද්ගල, ආත්ම වශයෙන් එකත්වයක් සේ ගැණීම වූ ඒකාංශවාදය හෙවත් ඝනසඤ්ඤාව මිථ්‍යාවක් බව ප්‍රකාශ කොට වදාළසේක.

පුද්ගල (ආත්ම) වාදාදි වශයෙන් එකල පැවැති මිථ්‍යාමත බුදුරජාණන් වහන්සේ වදාළ විභජ්ජවාදය අනුව මැඩලමින්, එසේ ම මතු ඇතිවන කුතාර්කිකයන් විසින් බුද්ධධර්මය සම්බන්ධයෙන් නැගිය හෙන මතාන්තර ද මැඩලීමට කරුණු දක්වමින් මොග්ගලිපුත්තතිස්ස මහරහතුන් වහන්සේ විසින් සැටදහසක් පමණ වූ සඟුන්මැද කථාවස්තුප්‍රකරණය 'විභාග' යන අර්ථ ඇති ප්‍රකරණ නාමයෙන් ම විභාවනා කරණ ලද්දේය.

එබැවින් මේ අභිධර්ම ග්‍රන්ථය ද මිථ්‍යාදෘෂ්ටිවිනිර්වෙෂ්ටනයෙන් සත්‍යඥාන උද්භාවනයෙන් තථාගතප්‍රවිදිත නිර්වාණාධිගමයට ප්‍රණීත වූ මාර්ගයක් බව නිවන් පසක් කරණු කැමැති සැදැහැවතුන් විසින් සැලකිය යුතු වේ. ලඞ්කාණ්ඩුව මගින් මහාජන මුදලෙන් මේ පාළිග්‍රන්ථය ඉතිහාසයෙහි පළමුවරට අපගේ සිංහල භාෂාවට පරිවර්තනය කරවා මුද්‍රණයට පැමිණ වීමෙන් ජනිත වන ධර්මදානමය පුණ්‍ය මහිමයෙන් මේ අධිකාරයට සම්බන්ධ මුද්‍රණ ශිල්පීන් ඇතුළු සියල්ලෝ ම නිදුක් වෙත්වා ! සුවපත් වෙත්වා ! නිවන් දකිත්වා ! යනු අපගේ ආශංසනය යි.

පරවාහැර වජිරඤාණ.
ත්‍රිපිටකපරිවර්තන කාරකසභාවෙහි ද
සංස්කාරකමණ්ඩලයෙහි ද සම්පාදක.

බුද්ධවර්ෂ 2511.
ත්‍රිපිටක කාර්යාලය,
174, සිරිවජිරඤාණ මාවත,
කොළඹ 9.

පරිවර්තක නිවේදනය

සුවිසේ ගෙවා දත් අප බුදුරජාණන් වහන්සේ පන්සාලිස්වසක් කෘතයුග-මහාමේඝයක් සෙයින් සිට දහම්වහරෙ වස්වනුවන් අනාගතයෙහි සද්ධර්ම ප්‍රතිරූපක උපදනා පරිදි දක්වමින් මහසුප් මහරහත්හට සද්ධම්මපතිරූපක සුත් දෙසා, දේශනාධර්මය පරීක්ෂා කොට ගතමනාසෙ දක්වමින් සඟනට මහාපදෙස සුත් දෙසා, සස්නට වන භය දක්වමින් අනාගතභය සුත් දෙසා, අනාගතාරක්ෂා පිණිසැ මං පහයා තබා පිරිනිවි පසු, දහම්සෝ සක්විති මහරජාණන් දවස තුන්වන සාහස්‍රිකධර්මසඞ්ගායනායෙහි සඞ්ඝස්ථවිර වැ සිටි මොග්ගලිපුත්තතිස්ස මහතෙරණුවන් මහාසඞ්ඝිකාදි සප්තදශනිකායවාසීන් තත්තත්සූත්‍රපදයෙහි අර්ථ වරදවා ගෙනැ දුල්ලබ්ධි උද්භාවනා කරනසෙ දැකැ, දෙව්ලොවැ අබිදම් දෙසමින් බුදුන් දුන් නය ගෙනැ පරවාද මර්දනය පිණිසැ සඟමැද දෙසූ කථාවත්ථුප්පකරණය සඞ්ගීතියට නැගීමෙන් පසු ථෙරියනිකායවාසීන් වාචනාමාර්ගයෙන් ගෙනැ ආසෙ මැ අද ද අප අතර පවත්නේ වෙයි.

අභිධර්මපිටකයෙහි සප්තප්‍රකරණයට ඇතුළත් කොට ප්‍රකරණනාමයෙන් තැබූ එ කථාවත්ථුප්පකරණය ගෙවුණු දෙවාදහස් දෙසිය පන්සැටෙහිදු සියබසට නො නැගුණේය. බුද්ධජයන්ති සංවිධානය සඳහා ලඞ්කාණ්ඩුව විසින් පිහිටුවන ලද ලඞ්කා බෞද්ධ මණ්ඩලය විසින් ඒ ප්‍රකරණය සියබසට නංවා තැබීමෙහි කාර්යභාරය අප වෙත දක්වා දෙනලදී. අපිදු මතු සඳහන් කරන පඬිවරුන්ගේ වහල් ද ලැබැගෙනැ තෙල දුෂ්කරකාර්යයෙහි ව්‍යාපෘත වූම්හ.

අපගේ ප්‍රිය ශිෂ්‍ය වන අහංගම විද්‍යාචන්ද්‍ර පිරිවෙන්හි ආචාර්ය, ශාස්ත්‍රවේදී පාතේගම මංගල ස්ථවිරයෝ ද, අපගේ ශිෂ්‍ය රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති ඩබ්ලිව්.ඒ.ජේ. විතාරණ (ඇම්. ඒ.) මහතා ද මෙහිලා සහාය වූවන් අතුරෙහි පළමු මැ සඳහන් කළයුතු වෙති. විතාරණ මහතා අර්ථව්‍යාඛ්‍යානයෙහි දී බෙහෙවින් වෙහෙස දැරූ බව වෙසෙසින් කියැයුතු වෙයි. මුද්‍රණය පිණිස දෙවනවර අත්ලිපි සකස් කිරීමෙහි දී වර්තමානයෙහි විද්වජ්ජනයාගේ ආදර-ගෞරවයට පාත්‍ර වූ මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, අපට කල්‍යාණමිත්‍ර වැ සිටුනා පණ්ඩිතාචාර්ය ලබුගම ලඞ්කානන්ද සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ ද, ධර්මවිනය ශබ්දශාස්ත්‍ර තර්කන්‍යායාදියෙහි ප්‍රවීණ පණ්ඩිතරත්නයක් වන කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ ද බෙහෙවින් වහල් වූහ. ලඞ්කානන්ද සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ අර්ථව්‍යාඛ්‍යානයෙහි විෂමස්ථාන සකස්කිරීමෙහි ද, සුමනසාර ස්ථවිරයන් වහන්සේ ග්‍රන්ථාගත පුච්ඡා - විසජ්ජනා සකස් කිරීමෙහි ද, පාඨසංශෝධනා හා වාක්‍යච්ඡේද වෙන් කිරීමෙහි ද බෙහෙවින් උපකාරී වූහ.

පොත් සපයාදීමෙහි ලා මාතර ශ්‍රී සුදර්ශිපරිවෙණාධිපති, පණ්ඩිතාචාර්ය කඩවැද්දුව සිරිනිවාස සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ ද, අහංගම එළකැටියේ බිම්බාරාමාධිපති වැ සිටි අහංගම පඤ්ඤාවංශ මහාස්ථවිරයන් වහන්සේ ද, ශ්‍රීමත් ජේම එච්. බස්නායක මැතිතුමා ද කළ අනුග්‍රහය කෘතඥතායෙන් සඳහන් කළයුතු වෙයි.

මෙහි සියලු දුෂ්ටස්ථාන සුසට කිරීමෙහි ද ප්‍රණීතාර්ථ එළිවාලීමෙහි ද එළිය දුන්නාහු නම්: විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි සම්මාන උපකුලපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය මහෝපාධ්‍යාය, දර්ශන විශාරද අතිගෞරවාර්හ පරවාහැර සිරිවජිරඤාණ කොළඹ නවකෝරළයේ ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන් වහන්සේ වෙති. උන්වහන්සේගේ නැණපහස නොහුනු තැනෙක් මෙහි නැත.

ග්‍රන්ථය පිළිබඳ යම් යම් වැදගත් කරුණු ගෙනැ සාකච්ඡා කිරීමෙහි දී විසිරගිය යශෝඝෝෂා ඇති අග්‍රමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායකස්ථවිරයන් වහන්සේ ද සහභාගී වැ සිටිබව කියම්හ.

අපගේ ආචාර්යෝත්තම විද්‍යාචන්ද්‍රපිරිවෙන්හි අධ්‍යක්ෂ, කීර්ති ශ්‍රී වාගීශ්වර පරදූව සිරි ජිනරතනාභිධාන තල්ජේපත්තුව ඇතුළු මාතරදිශායෙහි ප්‍රධානසඞ්ඝනායකමහාස්ථවිරයන් වහන්සේ නන් අයුරින් තෙල කෘතියෙහිලා අපට ධෛර්ය දුන් බව ද, ත්‍රිපිටක කාර්යමණ්ඩලයෙහි නියුක්ත, දෙරගමුවෙහි පණ්ඩිත ධම්මපාල ස්ථවිරයන් වහන්සේ මෙහි මහත් ආදරයෙන් හිතකර ව ක්‍රියා කළබව ද අවසානවශයෙන් සඳහන් කරම්හ.

කෝදාගොඩ ඤාණාලෝකස්ථවිර.

විද්‍යාචන්ද්‍රපිරිවෙන,
අහංගම.
දෙසැම්බර්, 1967.

සංඥාපනය

කථාවස්තු සංලක්ෂණය

සඞ්ගීති:

ශ්‍රී ශාක්‍යමුනි තථාගත සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ බුදු වැ සවිතේ ගෙවා දූන පන්සාලිස් වසක් මුළුල්ලෙහි චාතුර්ද්වීපික මහාමෙඝයක් සෙයින් සිව්සස් දහම් අමාවැසි වස්වා සසුන් පිහිටුවා අපමණ සත්ත්වහිත සම්පාදනය කොට නිරුපධිශේෂ පරිනිර්වාණධාතුයෙන් පිරිනිවන් පෑ කල්හි, ශාසනභාරධාරී වූ **මහාකාශ්‍යප** මහාස්ථවිරප්‍රමුඛ පන්සියක් මහරහතුන් වහන්සේ විසින් **අජාසත්** මහරජු සහාය කොටගෙන ධර්මවිනය සඞ්ඛ්‍යාත ශාසනය සඞ්ග්‍රහ කොට වදාරන ලද්දේ ය. මේ **ප්‍රථම සඞ්ගීතිය** මහාකාශ්‍යප ආනන්ද උපාලි ආදි සම්මුඛශ්‍රාවක මහතෙරවරුන් විසින් පැවැත් වූ හෙයින් **ථෙරියා** (ථෙරිකා) යි ද, පන්සියක් මැ වූ මහරහතුන් විසින් සඞ්ගීත වූ හෙයින් **පඤ්චසතිකා** යි ද ශාසන ඉතිහාසයෙහි පළට විය. ඒ ථෙරිය-සඞ්ගීතිය පිළිගත් ආචාර්යවංශය **ථේරවාද** නම් වී.

බුදුන් පිරිනිවි සියක් හවුරුදු ඉක්මැගිය සඳ වැදූරට මහණහු විශාලායෙහි දී විනයානුලොමික නො වූ සිඞ්ගිලොණකප්පාදි දශවස්තූන් පරිහරණය භික්ෂූනට කැප යයි ඇරුදූත්වූහ. ඒ අසා **කාකණ්ඩ** නම් බ්‍රාහ්මණපුත්‍ර ආයුෂ්මත් **යස** මහාස්ථවිරයන් වහන්සේ, සොරෙය්‍යවාසී **රේවත**, සාණවාසී **සම්භූත**, විසාලා වැසි **සබ්බකාමී** යන මහතෙරවරුන් ප්‍රමුඛ කොටගෙන, ඒ දශවස්තූන් මැඩැපියා, දොළොස් දහසක් පමණ භික්ෂූන් අතුරෙන් තෙවළාධර සිව්පිළිසිඹියා පත් සත්සියක් මහතෙරවරුන් තගාගෙන, ශුශුනාග පුත්‍ර **කාලාශොක** රජහු සහාය කොටගෙන, **දෙවන සඞ්ගීතිය** කළහ. එය සත්සියක් මහතෙරුන් විසින් කරන ලද හුයි **සත්තසතිකා** නම් වී.

ප්‍රථම සඞ්ගීතියෙහි මහතෙරුන් ධර්ම විනය විසින් පිටක විසින් නිකාය විසින් යම් සඞ්ග්‍රහයෙක් කරන ලද ද, වග්ග පණ්ණාස නිපාත පකරණ ඛන්ධකාදි යම් විභාගයෙකුත් කරන ලද ද, මෙ දෙවන සඞ්ගීතියෙහි ද එ හැම එලෙසින් සඞ්ගායනා කරන ලද්දේ ය. එහි කියැයුතු විශේෂයෙක් ද ඇති: පළමුවන ධර්මසඞ්ගායනාවෙන් පසු වැ බුදුන් වදාළ ධර්මන්‍යායෙහි මැ සිට **මහාකච්චායන**, **උදෙන** ආදි මහතෙරවරුන් දෙසූ මධුර, ඝොටමුඛ ආදි සූත්‍ර කෙනකුත් හා විනයෙහි පඤ්චසතිකක්ඛන්ධකය ද දෙවන සඞ්ගීති-යෙහි දී සඞ්ගායනාවට නගාලූහ.

බුද්ධභාෂිත වූ ධර්ම විනය එලෙසින් නො පිළිගත් හෙයින් ඒ ධර්ම විනය සඞ්ග්‍රාහක මහතෙරුන් විසින් නිගන්නා ලද දසදහසක් පමණ **වජ්ජීපුත්තක** භික්ෂූහු පක්ෂ සොයන්නාහු විශාලායෙහි අවකාශ නො ලැබ, කෞශාම්බියට ගොස් තමනට අනුරූප මතධාරී දුර්වල පක්ෂ ලැබ, **මහාසංඝික** යයි වෙන ම ඇදුරොලක් ඇති කළහ. ඔහු එක් වැ ගෙන ධර්මසඞ්ගීතියකුදු කළහ. එ **මහාසඞ්ගීති** නම් වී. අධර්මවාදී මහාසඞ්ගීති-කාරකයෝ බුදුසසුන විලොම කළහ. මහසුප් ආදි මහතෙරුන් කළ මූලසඞ්ග්‍රහය බිඳ, එයට වෙනස් වූ ධර්මසඞ්ග්‍රහයක් කළහ. එක් තැනෙක

සඞ්ගෘහීත වූ සූත්‍රය එයින් අන් තැනෙක තැබූහ. විනයෙහි ද පස්මහ-සඟියෙහි ද පෙළ හා අරුත් හා බිඳලූහ. පර්‍ය්‍යාය නිෂ්පර්‍ය්‍යාය දේශිතය ද නෙය්‍යාර්ථ නීතාර්ථ සූත්‍රය ද නො දැන ව්‍යඤ්ජනච්ඡායායෙන් අරුත් ගෙන යථාර්ථය නසාපූහ. විනය හා සූත්‍ර හා එක් දෙසක් හැරපියා තමනට අභිමතයක් එයට එක් කොට සූත්‍රවිනයප්‍රතිරූපයන් කළහ. පරිවාර අර්ථෝද්ධාර සඞ්ඛ්‍යාත පදභාජනිය, අභිධර්ම ෂට්ප්‍රකරණය, ප්‍රතිසංවිදාමාර්ග, නිර්දේශ, ජාතක එකදෙශයක් ද හැරලීහ. නාම, ශ්‍රමණලිඞ්ග, ශ්‍රමණපරිෂ්කාර, ශ්‍රමණආකල්ප යන මෙ ද වෙනස් කළහ. මේ දක්වූයේ මහාසාඞ්ඝිකයන්ගේ සඞ්ගීතිය ගෙන **දීපවංශයෙහි** එන වාර්තා යි.

ඒ අනුව ඔවුන්ගේ මහාසඞ්ගීතිය විමසා බැලුව මනා යැ:

1. බුදුන් පිරිනිවි සාරසිය සූපනස් (454) වසක් ඉක්මැයන තුරු පෙළ-දහම පොතපතෙහි නො ලියැවිණ. ඇදුරු මුඛයෙන් ම මුඛපාඨ-වශයෙන් උගතයුතු ව තුබූ තෙවළා පර්‍ය්‍යාප්ති කොට පුහුණු කළ එක ද භික්ෂු කෙනෙක් දසදහසක් වජ්ජිපුත්තකයන් කෙරෙහි නො වූහ.

2. මහාසාඞ්ඝික නිකායිකයනට නිශ්‍රයාචාර්‍ය්‍ය වූයේ **රේවත** මහ-තෙරණුවන්ගේ අතැවැසි උපස්ථායක ව සිටි විසිවස් ඇති **උත්තර නම් ස්ථවිර** කෙනෙකි. හෙ ද උපාධ්‍යායයන් වහන්සේ සමීපයෙහි ත්‍රිපිටක ධර්මය හදාරා නිමැවූයේ හෝ ශාසනයෙහි ලද ප්‍රතිෂ්ඨා ඇතියේ හෝ නො වේ.

3. ඔවුන් නිශ්‍රයාචාර්‍ය්‍ය කොට ගත් ඒ උත්තර නම් මහණ ආමිෂලාභ-යෙන් පෙලැඹුණේ අධර්මසමාදාන හේතුයෙන් ස්වකීය උපාධ්‍යායයන් වහන්සේ විසින් නෙරපා හරින ලදුයේ ද වෙයි. (සත්ත-සතිකක්ඛන්ධකය විමසන්න.)

4. ඔවුන්ගේ සඞ්ගීතියෙහි පළමු කොට මැ ස්ථවිර භික්ෂූන් විසින් 'අධර්ම යැ අවිනයැ'යි ප්‍රතික්ෂෙප කළ 'සිඞ්ගිලොණකප්පාදි' දශවස්තුව ඇතුළු විය.

5. ආචාර්‍ය්‍යමුඛයෙන් ලත් උද්ග්‍රහණයෙහි අපරිපූර්ණ බව හේතු කොට-ගෙන ඔවුනට විෂය නො වූ පරිවාර පටිසම්භිදා නිද්දෙස ආදිය උන්ගේ සඞ්ගීතියෙහි සඞ්ගෘහීත නො වී ය.

6. ඇදුරුපරපුරින් ගෙන එන ලද ත්‍රිපිටක අර්ථකථා මාර්ගය හෝ ආචාර්‍ය්‍යවාද හෝ ඔවුනට නො වී ය.

7. ස්ථවිර භික්ෂූන් කෙරෙහි කළ අසහනයෙන් මැඩිගිය ඔවුනට සඞ්ගීතියක ආවශ්‍යකතාව නම් ස්ථවිරවාදීනට පිළිමල් ව සිටීම විය.

මේ ආදි කරුණු විමසත් මැ මහාසාඞ්ඝිකවාදීන්ගේ මහා-සඞ්ගීතිය අපරිශුද්ධ වූවක් බව කියැයුතු ය.

නිකායාන්තරිකයෝ:

මියර බුන් දියතලාවක් සෙයින් ස්ථවිරවංශයෙන් බිඳීගිය ඒ **මහාසාංඝික** ඇදුරුකුලයෙන් **ගොකුලික** යැ **එකබ්බොහාරික** යැ යි අන්‍ය ආචාර්‍ය්‍යවංශ දෙකෙක් උපන. ගොකුලික නිකායෙන් බිඳී **පඤ්ඤත්තිවාදී** යැ **බාහුලික** (බාහුශ්‍රැතික) යැ යි අන්‍ය දෙනිකායෙක් ද ඇති විය. බාහුලිකයන් අතුරෙහි මැ **චෙතියවාද** නම් අතිකුදු ආචාර්‍ය්‍යවාදයෙක් පහළ විය. මෙසේ මහාසාඞ්ඝිකයන් හා ආචාර්‍ය්‍යවාද සයෙක් පහළ විය.

මහාසාඞ්ඝික නිකාය අනුකරණය කෙරෙමින් දෙවැනි සියවසෙහි දී මැ ස්ථවිරවංශයෙන් බිඳී **මහිංසාසක** යැ **වජ්ජිපුත්තක** යැ යි ආචාර්‍යවාද දෙකෙක් උපන. එහිදු වජ්ජිපුත්තකවාදයෙන් බිඳී **ධම්මුත්තරිය** යැ **භද්‍රයානික** යැ **ඡන්නාගරික*** යැ **සම්මිතීය** යැ යි අතිකුදු ආචාර්‍යවාද සතරෙක් පහළ විය. මහිංසාසකවංශයෙහුදු බිඳී **සබ්බත්ථවාදී** යැ **ධම්මගුත්තික** යැ යි ආචාර්‍යවාද දෙකෙක් ද, සබ්බත්ථිවාදයෙන් බිඳී **කස්සපික** නම් වූ ද, උත්ගෙන් **සඞ්කන්තික** නම් වූ ද, එයින් **සුත්තවාද** නම් වූ ද ආචාර්‍යවාදයෝ උපන්හ. ඔහු ස්ථවිරවාදය සමග දෙළොස් ආචාර්‍යවාද කෙනෙක් වෙති. මේ දෙළොස ද මහාසාඞ්ඝිකයන්ගේ ආචාර්‍යවාද සය දැයි අටළොස් ආචාර්‍යවාද කෙනෙක් දෙවැනි සියවස තුළ පහළ වූහ. අටළොස් නිකායයනුදු අටළොස් ආචාර්‍යකුලයනුදු කුලුත්ට මැ නම්. මෙයින් සතළොස් වාද කෙනෙක් භින්න වූවාහු බුදු-සසුන් මහරුක්හි විසකටු සෙයින් උපන්හ. ස්ථවිරවාදය පමණක් මැ අසම්භින්න වූයේ ය. එහි ආචාර්‍යවරයෝ දිවි දෙවැනි කොට තබා ජින-ශාසනය අනූන අනධික කෙවලපරිපූර්ණ පරිශුද්ධ කොට රක්මින් වැටෙන්නාහු වෙත්.

අශෝක සමය:

යථොක්ත අටළොස් ආචාර්‍යවාදයන්ගේ වශයෙන් සසුන් පවත්නා කල්හි දඹදිවැ ද්වීපචක්‍රවර්ති **අශෝක ධර්මරාජ** තෙමේ උපන් සැදැහැතියේ දවසැ දවසැ පන්ලක්‍ෂයක් වැය කොට බුදුසසුන්හි මහත් අධිකාර පැවැත්විය. නව ලාභ ඇති තීර්ථකයෝ ලාභ සත්කාර සඳහා සසුන් වැද සසුනට අනේක ප්‍රකාර අර්බුදමල කණ්ටක උපදවාලූහ. ඔහු උපොසථ කර්මාදියෙහි දු සඟ මැදට පිවිසෙති. භික්‍ෂුසඞ්ඝයා වහන්සේ උන් සමග පොහෝ පවුරුණු නො කළහ. අශෝකාරාමයෙහි සත් අවුරුද්දක් පොහෝ පවුරුණු නැවැතිණ. රජ-අණින් පොහෝ කරවන්නට ගිය බධිරගති ඇති බාල ඇමැතියකු විසින් බොහෝ භික්‍ෂූන් දිවියෙන් තොර කරනු ලැබූ කල්හි, උපන් විපිළිසර ඇති රජ එ විපිළිසර හරනා සඳහාත් බුදුසසුන් නිරර්බුද කරනු සඳහාත් අහොගඞ්ගපර්වතයෙහි වැඩහුන් **මොග්ගලිපුත්තතිස්ස** මහතෙරුන් වහන්සේ වැඩමවා, ඔබ අනින් සසුන් සමය ඉගෙන (අටුවායෙහි කී සෙයින්) සැටදහසක් අත්තොට්වන් සුදුවත් හඳවා සසුනින් නෙරපියා, 'වහන්ස, දැන් සසුන ශුද්ධ යැ, පොහෝ කළ මැනැවැ' යි සඟනට ආරාධනා කොට අරක් දී නුවරට පිවිසියේ ය. සැටදහසක් පමණ වූ සමග මහා-සඞ්ඝයා වහන්සේ අශෝකාරාමයෙහි රැස්ව පොහෝ කළහ.

කථාවස්තු දේශනාව:

ඒ සමාගමයෙහි **මොග්ගලිපුත්තතිස්ස** මහරහතුන් වහන්සේ **වජ්ජිපුත්තක - සම්මිතීය** ආදි නිකායවාසීන් තත් තත් පිටක සූත්‍රපදයෙහි සම්මෝහයෙන් අර්ථ වරදවා ගෙන උපදවා තුබූ **පුග්ගලකථා** ආදි වස්තූන් ද, ශාසන විලෝම වැ මතු උපදනා වස්තූන් ද ප්‍රතිබාහන සඳහා බුදුරදුන් වදළ අභිධර්ම නය වශයෙන් මැ කථාවස්තු මාතෘකා විභාග කරමින් සකවාදයෙහි සූත්‍ර පන්සියෙකැ, පරවාදයෙහි සූත්‍ර පන්සියෙකැ'යි සූත්‍ර දහසක් සාධක වශයෙන් එළවා **කථාවත්ථුප්පකරණය** වදළහ.

---

* ඡන්නාගාරික - බොහෝ පොත්

"මොග්ගලිපුත්තතිස්ස මහතෙරණුවන් කථාවත්ථුව ප්‍රබන්ධ කරන ලදැ"යි ඇතැම් විචාරකයෝ කියති. ඒ උන්ගේ මතිමාත්‍ර වන් මුත් ඔබ ප්‍රබන්ධ කළ කථාවත්ථුයෙක් නැත. ධම්මසඞ්ගණී ආදි ෂට්ප්‍රකරණය සැරියුත් මහතෙරණුවන් වාචනාමාර්ගයට නඟා දේශනා කළ පරිදි මැ කථාවත්ථු-ප්‍රකරණය ද මොග්ගලිපුත්තතිස්ස මහතෙරුන් විසින් වාචනාමාර්ගයට නඟා සඟමැද දෙසන ලද්දේ ය:

බුදුරජාණන් වහන්සේ යමාමහපෙළහර අවසනැ තිදසපුර පරසතුරුක් මුලැ පඬුඇඹුල්සලයෙහි වැඩහිඳ මාතෘදිව්‍යරාජයා කායසාක්ෂි කොට විජම් බණ දෙසන සේක් - සැරියුත් මහ තෙරණුවන්හට එහි නය පහදා වදාළාක් මෙන්, කථාවත්ථු දේශනාවසරයෙහි "අනාගතයෙහි මාගේ සව් මහපැනැති මොග්ගලීපුත්තතිස්ස නම් තෙර කෙනෙක් උපන් ශාසනමල විසෝධා පුද්ගලකථාදි කථාවනට වස්තු වූ ධර්මජාතය විභාග කොට දක්වති" දැන නානාප්‍රකාර ලබ්ධි විශෝධනයට ද්වාර වූ, පෙළ විසින් බණවරක් තරම් වනසේ කථාවත්ථුමාතෘකා දේශනා කොට වදාළ සේක. මහතෙරණුවෝ බුදුන් වදාළ නයෙහි සිට ඒ මාතෘකා පෙළ විසින් මැ විභාග කළහ.

එහි දක්වූ වාදමාර්ගය යම් කිසි වාදී කෙනකුන් සමග උන් ඉදිරියෙහි කථාප්‍රතිකථායෙන් වාද කොට ප්‍රකාශ කරනලද්දෙකුදු නො වෙයි. තමන් වහන්සේ විසින් මැ නිකායාන්තරිකයන්ගේ ලබ්ධි විශෝධනය සඳහා සකවාදී පරවාදී පුච්ඡා විස්සජ්ජනා වශයෙන් වදාරන ලද්දේ ය.

තෙ වන සඞ්ගීතිය:

ඒ සමාගමයෙහි රැස්වූ සැටදහසක් පමණ භික්ෂූන් වහන්සේ අතුරෙන් ත්‍රිපිටකධර වූ සිව්පිළිසිඹියාපත් එක් දහසක් මහතෙරවරුන් නඟාගෙන පළමුවන දෙවන සඞ්ගීතිද්වයෙහි මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ හා යශස්ථවිරයන් වහන්සේ හා ප්‍රමුඛ කොටගෙන ධර්මවිනය සඞ්ගායනා කළ සෙයින් මැ තුන් වැනි ධර්මසඞ්ගීතිය ද පවත්වාලූහ. මේ සඞ්ගීතිය දහසක් මහරහතුන් වහන්සේ විසින් කළ හෙයින් සාහස්සිකා නම් වී. මෙහි දු විශේෂයෙක් නම්: විනය චූලවග්ගයෙහි පඤ්චසතිකක්ඛන්ධකයට අනතුරු කොට දෙවැනි සඞ්ගීති කථායෙහි ප්‍රකාශිත සත්තසතිකක්ඛන්ධකය ද, අභිධර්මසඞ්ගීතියට පැමිණ පුග්ගලපඤ්ඤත්තිප්පකරණයට අනතුරු කොට කථාවත්ථු මාතෘකා විභාග කොට වදාළ කථාවත්ථුප්පකරණය ද සඞ්ගීතියට නඟාලීම යි.

තවද චූලවග්ගපාළියෙහි භික්ඛුනීක්ඛන්ධකයට අනතුරු කොට ඒකාදශ ද්වාදශ ඛන්ධකයන් වශයෙන් පඤ්චසතික සත්තසතිකක්ඛන්ධකයන් (පළමුවන දෙවන සඞ්ගීති කථා) සඟහා ලූ පරිදි තෙවන සඞ්ගීති කථා වශයෙන් සාහස්සිකක්ඛන්ධක නම් තෙළෙස්වැනි ඛන්ධකයක් එහි නො ආයේ කවර හෙයින යත්: මහාසඞ්ගායනාත්‍රය මෙන් සිව්වැනි ධර්මසඞ්ගීතියක් නො-පැවැත්ම එයට හේතු විය. ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීතිකාරකයන් විනයානුකූල කොට සම්මත කළ ඤත්තිදුතිය කර්මය ද, ද්විතීයසඞ්ගීතියෙහි දශවස්තු විනිශ්චය සඳහා සම්මත කළ ඤත්තිකර්මය ද විනයෙහි දක්වාලීමේ යොග්‍යත්වය නිසා විනයක්ඛන්ධක අතුරෙහි එම සඞ්ගීතිකථා සඞ්ගෘහීත වී යයි සැලැකිය සුතු ය.

භින්නනිකායවාදීහු:

බුදුන් පිරිනිවි දෙවැනි සියවස ඇතුළත උපන් සතළොස් භින්න-වාදයෝ යට දක්වන ලදහ. තුන්වැනි සඞ්ගීතියෙන් පසු ව ද කලින් කල **හෙමවතික** යැ **රාජගිරික** යැ **සිද්ධත්ථික** යැ **පුබ්බසෙලීය**යැ **අපරසෙලිය** යැ **වාජිරිය** යැ යි ආචාර්‍යවාද සයෙක් උපන. ධම්ප්‍රදීපිකායෙහි **ගුරුළුගෝමී** ඇදුරන් විසින් "එක්බිති මහාසාඞ්ඝිකාදි සප්තදශ නිකායවාසී බුදුසතුරන් ... පසු වැ හෙමවතාදි නවනිකායවාසී ..." යනාදියෙන් අන්‍ය නිකාය නවයෙක් පැවැති සේ දක්වන ලද්දේ ය. එ **පඤ්චප්පකරණ** අටුවායෙහි තැනින් තැනැ සඳහන් ලත් **උත්තරාපථක** යැ **වෙතුල්ලක** යැ **හෙතුවාදී** යැ යන තුන් නිකාය ද එක් කොට ගැනීමෙනි. වැඩි ගණනක් වාදකථා විභයෙහි සඳහන් ලැබෙන **අන්ධක** යන නාමය වූ කලි පූර්වශෛලීය, අවරශෛලීය, රාජගිරික, සිද්ධාර්ථික යන නිකාය සතර සඳහා ව්‍යවහාර කරන ලද්දෙකි. එ මැ කිය කථාවත්ථු අටුවායෙහි: "අන්ධකා නාම – පුබ්බසෙලියා අපරසෙලියා රාජගිරිකා සිද්ධත්ථිකාති – ඉමෙ පච්ඡා උප්පන්නනිකායා"යි. **ආන්ධ්‍ර** දෙශයට සමීපයෙහි වූ **ධාන්‍යකටක**යෙහි 'පූර්වශිලා, අවරශිලා' යයි ආරාම දෙකක් තුබූ බව චීන සංචාරක **හ්‍යුංසාං** කියයි. එ අරම්වැසි ඇදුරන් උපදවාලූ වාද හෙයින් පූර්වශෛලීය අවරශෛලීය නම් වී යයි ද, රාජගිරික සිද්ධාර්ථික යන වාද ආන්ධ්‍රදෙශිකයන් මැ උපදවාලූ එහෙයින් ද – මේ ආචාර්‍යවාද සතර එක් කොට **අන්ධක** නාමයෙන් කථාවත්ථු අටුවායෙහි හඳුන්වන ලද බව සැලැකිය යුතු ය.

නිකායාන්තර හා කථාවත්ථුව:

යට දැක්වූ සවිස්සක් පමණ භින්න නිකායවාසීන් විසින් ත්‍රිපිටක පර්‍යාප්ති සඞ්ඛ්‍යාත ජිනශාසනය වරදවාගෙන නිපදවාලූ විවිධ ලබ්ධි විශොධනය සඳහා කථාවත්ථුමාතෘකා පාළිය විභාග කරනලද්දේ ය. එහි **පුග්ගලකථා, පරිහාණිකථා** ආදි වාදස්ථානයෝ දෙසියසතළොස (217) ක් පමණ වෙති. අටුවා ඇදුරු බුදුඝොස් මහතෙරුන් වහන්සේගේ කාලය වන විට එ කී ආචාර්‍යකුලයන් අතුරෙන් බොහෝ ගණනක් අභාවයට ගොස් හෝ නිකායාන්තරයන් හා සම්මිශ්‍රණයට පැමිණ හෝ තුබූ බව පෙනේ. ඉතිරි වැ සිටි වාදීහු නම්:

1. අන්ධක
2. අපරසෙලීය
3. උත්තරාපථක
4. කස්සපික
5. ගොකුලික
6. පුබ්බසෙලීය
7. භද්‍රයානික
8. මහාසඞ්ඝික
9. මහිංසාසක
10. රාජගිරික
11. වජ්ජිපුත්තක
12. වෙතුල්ලක
13. සබ්බත්ථිවාද
14. සම්මිතීය
15. සිද්ධත්ථික
16. හෙතුවාද

යන මොහු ය. මොවුනතුරෙහි 'අන්ධක, උත්තරාපථක, වෙතුල්ලක, හෙතු-වාද යන සතර නිකායයෝ පසුව ප්‍රකාශයට පැමිණියාහු වෙති. අන්ධක නාමයෙන් පුබ්බසෙලීයාදි නිකාය සතරක් ගත් බව කියා ඇත.

අශොක සමයෙහි සසුන් වැදී සිටි අන්‍යතීර්ථකයන්ගේ වාද බිඳුනට 'කථාවත්ථුව දෙශිතය'යි ඇතැම් කෙනෙක් කියති. එ ද උන්ගේ කල්පනා මාත්‍රයෙකි. ලාභහේතුයෙන් සසුන් වැදී සිටි තීර්ථකයෝ හෙළ පිළී හඳවා

සසුනින් බැහැර කරනු ලැබූහ. දෙවැනි සඞ්ගීතියෙන් පසු භින්නවාද ගෙන සිටි සතළොස් නිකාය වාසීහු සසුනෙහි මැ රැඳී සිටියහ. මහාසමාගම්-යට රැස්වූ සැටදහසක් පමණ භික්ෂූහු ස්ථවිරවාදීහු මැ යැ. කථාවත්ථුව දෙසන ලදුයේ වජ්ජිපුත්තකාදි නිකායවාසීන් "අත්ථි පුග්ගලො අත්තහිතාය පටිපන්නො" යනාදි සූත්‍රපදයන් වරදවා ගෙන උපදවාලූ භින්නලබ්ධි විශෝධනය සඳහා මැ යැ.

කථාවත්ථුප්පකරණ:

පුද්ගලවාදකථා ආදි වාදයනට වත්ථු (භූමි) වූ කාරණ **කථාවත්ථු** නම් වෙයි. ඒ කථාවස්තූන් සඞ්ග්‍රහ කොට දේශනා කළ ප්‍රකරණය ද **කථා-වත්ථුප්පකරණ** නම් වී. මෙහි එන වාදකථා දෙසිය සතළොසෙකි. එ හැම වර්ග තෙවිස්සෙක සඞ්ග්‍රහ කොට ඇත. එහි ආදි වූයේ පුග්ගලකථා යැ. ප්‍රකරණය වාචනා මාර්ගයට නඟාලීමේ දී පුද්ගලකථාව සම්පූර්ණයෙන් විස්තර විය. එයින් මත්තෙහි 'පරිහානිකථා' ආදිය පෙය්‍යාල විසින් සංක්ෂිප්ත කරන ලද්දේය. එහෙයින් පුග්ගලකථායෙහි එන වාද ක්‍රමය අනුව හැම වාදකථාවක් ම සුදුසු පරිදි විස්තර කළ යුතු ය.

පුග්ගලකථා විභාගය:

මෙහි මුලින් විභාග කළ පුග්ගල කථාව- 1 සුද්ධසච්චිකට්ඨ යැ, 2. සුද්ධික සංසන්දනා යැ, 3. ඔපම්මසංසන්දනා යැ, 4. චතුක්කනයසංසන්දනා යැ, 5 ලක්ඛණයුත්තිකථා යැ, 6. වචනසොධන යැ 7. පඤ්ඤත්තානුයොග යැ, 8. ගති - චුති - පටිසන්ධි අනුයොග යැ, 9. උපාදාපඤ්ඤත්තානුයොග යැ, 10. පුරිසකාරානුයොග යැ, 11. අභිඤ්ඤානුයොග යැ, 12. ඤාතක-ජාති-පටිපත්ති - උපපත්ති අනුයොග යැ, 16. පටිවෙධානුයොග යැ, 17. සඞ්ඝානුයොග යැ, 18. සච්චිකට්ඨසභාවානුයොග ය යි අටළොස් අයුරෙකින් පුද්ගලප්‍රශ්න-විභාග කොට ඇත.

එහිදු සච්චිකට්ඨ ප්‍රශ්නකථාව සුද්ධසච්චිකට්ඨ යැ, ඔකාසසච්චිකට්ඨ යැ, කාලසච්චිකට්ඨ යැ, අවයව සච්චිකට්ඨයැ යි සච්චිකට්ඨ සතරෙකින් යුක්ත වෙයි.

කථාවත්ථු පාළියෙහි සුද්ධසච්චිකට්ඨය පමණක් මැ සම්පූර්ණයෙන් විභාග කොට දක්වන ලද්දේ ය. ඔකාසසච්චිකට්ඨයෙහි පටන් ප්‍රකරණය මුළුල්ල පෙය්‍යාලමුඛයෙන් සඞ්ග්‍රහ කොට ඇත. එහෙයින් සුද්ධසච්චිකට්ඨය විස්තර කළ නයින් කථාවත්ථු ප්‍රකරණයෙහි එන වාදකථාක්‍රමය අවබොධ කටයුතු වෙයි.

සුද්ධසච්චිකට්ඨයෙහි අනුලොමපච්චනීකපඤ්චක යැ, පච්චනීකානුලොම-පඤ්චක ය'යි පඤ්චක දෙකෙකි. එයින් පළමුවැන්න අනුලොමපඤ්චක, පටිකම්මචතුක්ක, නිග්ගහචතුක්ක, උපනයනචතුක්ක, නිගමනචතුක්ක' යැ යි කොටස් පසෙකින් ද, දෙ වැනි පඤ්චකය 'පච්චනීකපඤ්චක, පටිකම්ම-චතුක්ක, නිග්ගහචතුක්ක, උපනයනචතුක්ක, නිගමනචතුක්ක යැයි කොටස් පසෙකින් ද යුක්ත වෙයි.

"පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙන? යො සච්චිකට්ඨො පරමට්ඨො, තතො සො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙන"යි පුච්ඡං, අනුයොග විසින් පරවාදී පක්ෂය ගත් වාදයෙහි හෙවත් ලබ්ධියෙහි

නිග්‍රහ (දෝෂ) ය නඟාලීම ය, අනුලෝම පටිලෝම වශයෙන් දෙවැදෑරුම් වූ පාපනා හෙවත් ‘තෙන වත රේ’ යනාදීන් නිග්‍රහය පමුණුවාලීම ය, ආරෝපනා හෙවත් “යං තත්‍ථ වදෙසි” යනාදීන් නිග්‍රහය අරෝපණය කිරීම ය යන කරුණු පසින් යුක්ත වූයේ අනුලෝම පඤ්චක නම් වේ. මෙහි අනුලෝම පටිලෝම විසින් ඨපනා දෙකකුදු ඇතියෙන් ‘සත්තක’ යයි කියැයුතු යැ. එසේ නො කීමෙහි යුක්ති කිම? මෙහි ‘ඨපනා’ නම්: “මේ තොපගේ දෝෂයැ”යි පරවාදී පක්‍ෂය එහි පිහිටුවාලන හෙයින් වාදස්ථාපනමාත්‍රයෙක් ම මුත් පාපනාරෝපනා සෙයින් අනුලෝම පටිලෝම පඤ්චකයෙහි ප්‍රධාන අවයවයෙක් නො වේ.

“පුග්ගලො නූපලබ්භති” යනාදීන් පරවාදීහු විසින් අනුලෝමයෙන් හා ප්‍රතිලෝමයෙන් පාපනාආරෝපනා චතුෂ්කයාගේ වශයෙන් කළ ප්‍රතිකර්ම හෙයින් දෙවැන්න පටිකම්මචතුක්ක නම් විය. පටිකම්ම, නිග්ගහ, උපනයන, නිගමන, යන චතුෂ්කයෝ ද සිව්වැදෑරුම් පාපනාරෝපනයන්ගේ වශයෙන් ලැබෙන සැටි සැලකියයුත්තාහු ය. මෙසේ “පුග්ගලො උපලබ්භති” යනාදි අනුලෝම පඤ්චකයාගේ ද “නූපලබ්භති” යනාදි වූ පටිකම්ම – නිග්ගහ-උපනයන – නිගමන චතුෂ්කයන්ගේ ද වශයෙන් අනුලෝම – පච්චනීක – පඤ්චක ලැබෙති.

“පුග්ගලො නූපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙන” යනාදීන් පච්චනීකනය පරවාදීහුගේ පුච්ඡායෙන් ඇරඹෙයි. එහි පච්චනීක නයින් විරුද්ධපක්‍ෂය පිහිටුවාලීම යැ, අනුලෝම පටිලෝම වශයෙන් සිව්වැදෑරුම් වූ පාපනා ආරෝපනා යැ යන මේ පච්චනීකපඤ්චක නම් වේ. යළි “උපලබ්භති පුග්ගලො” යනාදි වූ “පටිකම්ම-නිග්ගහ-උපනයන-නිගමන චතුෂ්කයන්ගේ වශයෙන් පච්චනීකානුලෝමපඤ්චක නම් දෙවැනි පඤ්චකය ගැනේ.

මෙසේ මේ පළමුවැනි සච්චිකට්ඨයෙහි පඤ්චකයෝ දෙදෙනෙක් වෙති. ඒ පඤ්චකද්වයෙහි නිග්‍රහ දෙකෙකි. පළමුවැනි පඤ්චකයෙහි සකවාදී විසින් පරවාදී හට කළ නිග්‍රහය ශුද්ධ යැ. එහි පරවාදීහු විසින් පටිකම්ම වශයෙන් ඡලවාදයෙන් ලත් ජය අශුද්ධ යැ. අධර්මයෙන් ලත් ජය හෙයිනි. දෙවැනි පඤ්චකයෙහි පරවාදී විසින් සකවාදී හට කරන නිග්‍රහය අශුද්ධ යැ. යළි සකවාදී විසින් ධර්මවාදයෙන් පටිකම්ම කොට ලත් ජය ශුද්ධ යැ. ධර්මවාදයෙන් ලත් ජය හෙයිනි.

කථාවත්ථුප්‍රකරණයෙහි එන සියලු වාදකථා මේ පළමුවැනි සච්චිකට්ඨය විභාග කළ ලෙසින් විමසා දත යුතු ය.

කථාවත්ථුයෙහි වාදක්‍රමය:

කථාවත්ථුප්‍රකරණයෙහි එන වාදක්‍රමය ‘ඨපනා, පාපනා, ආරෝපනා යන අවයව තුනෙකින් යුක්ත ය. එහි ඨපනා නම්: විරුද්ධ මතය බිඳිනු සඳහා ඉදිරිපත් කරන වාදකථාවේ පූර්වපක්‍ෂ යි – ප්‍රධාන තර්කාඞ්ග යි. ඨපනායෙන් පැමිණෙන ඵලය පාපනා නම් වෙයි. එයින් ප්‍රතිවාදියා මත නැඟෙන නිග්‍රහය හෙවත් පරාජය ආරෝපනා නම් වේ. මේ වාදක්‍රමය තවත් පහසුවෙන් වටහාගනු සඳහා නිදසුනක් එළවාලම්හ.

(1) සකවාදී: අකාර දෙකක් එක් වැ සන්ධි වීමෙන් ‘ආ’ කාරයෙක් වේ ද?
(පුච්ඡා)

පරවාදී: එසේ යැ (පටිජානනා – පටිඤ්ඤා)

සකවාදී: ඉකාර දෙකක් එක් වැ සන්ධි වීමෙන් ඊකාරයෙක් වේ ද? (අනුයොග)

පරවාදී: එසේ නො කියැයුතු යැ. 'නැත' යනුයි (පටික්ෂෙප)

සකවාදී: අකාර දෙකක් එක් වැ සන්ධි වීමෙන් ආකාරයෙක් වේ නම්, (අනුලොම-ඨපනා.)

සකවාදී: ඉකාර දෙකක් එක් වැ සන්ධි වීමෙන් ඊකාරයෙක් වේ යයි කියැයුතු යැ. (අනුලොම පාපනා)

සකවාදී: අකාර දෙකක් එක් වැ ආකාරයක් වන බව පිළිගන්නා තෙපි ඉකාරද්වයක් එක් වැ ඊකාර වනු නො පිළිගන්නාව එහෙයින් ඉකාරද්වයක් එක් වැ ඊකාර නො වේ යයි තොප කියන බස සාවද්‍ය ය. තොපගේ බස වරද බව ඔප්පු වී යයි සේ යි. (අනුලොම - ආරොපනා.)

කථාවත්‍ථුයෙහි එන වාදක්‍රමය මෙ බඳු යි. මෙය මැ අවරදිගැ නූතන තර්කක්‍රමය අනුව මෙසේ සිටී:

අ අ දෙක ආ වේ නම්,
ඉ ඉ දෙක ද ඊ වෙයි. (එහෙත් තොප මතයෙහි ඉ ඉ දෙක ඊ නො වෙයි.)
එසේ නම්, අ අ දෙක ද ආ නො වේ.

මේ දක්වන ලදුයේ අනුලොම පක්‍ෂ යි.

කථාවත්‍ථුයෙහි එන පටිලොම පක්‍ෂයෙහි නිදසුන් මෙසේ යැ:

(2) සකවාදී: ඉ ඉ දෙක එක් වැ ඊකාර නො වේ නම්, (පටිලොම - ඨපනා)

සකවාදී: අ අ දෙක එක් වැ ආකාරයෙක් වේ යයි ද නො කියැයුතු යැ. (පටිලොම - පාපනා)

සකවාදී: ඉ ඉ දෙක එක් වැ ඊකාර නො වේ යයි තොප කියන බස මිත්‍ය්‍යා වේ. (පටිලොම - ආරොපනා)

මෙය අවරදිගැ තර්කක්‍රමය අනුව මෙසේ සිටී:

ඉ ඉ දෙක ඊ නො වේ නම්,
අ අ දෙක ද ආ නො වේ.
එහෙත් අ අ දෙක ආ වෙයි.
එහෙයින් ඉ ඉ දෙක ද ඊ වේ.

අවරදිගැ ක්‍රමයෙහි අනුලොම ප්‍රතිලොම පක්‍ෂ දෙකින් ම පාපනාව බැහැර කරනලද වේ.

පූර්වපක්‍ෂය හෙවත් ප්‍රධාන තර්කාඞ්ගය පසුව දක්වූ ක්‍රමයට පෙරළුව හොත් ලැබෙනුයේ මෙසේ යැ:

අ අ දෙක ආ වේ නම්,
ඉ ඉ දෙක ද ඊ වෙයි.
අ අ දෙක ආ වෙයි.
එහෙයින් ඉ ඉ දෙක ඊ වේ.

දෙවැනි තර්කක්‍රමයෙන් පරවාදීන්ගේ දෙවැනි උත්තරය යළි පිහිටුවනු ලැබෙයි.

(3) පරවාදී: අ අ දෙක ආ නො වේ නම්,
ඉ ඉ දෙක ද ඊ නො වේ.
අ අ දෙක ආ නො වේ යයි ද, එහෙත් ඉ ඉ දෙක ඊ වේ යයි ද තෙපි කියව.
අ අ දෙක ආ නො වේ නම්, ඉ ඉ දෙක ද ඊ නො වේ.

(4) යළි පරවාදී කියයි: මේ ප්‍රතිබාහනය සාවද්‍ය ද? එය තොප කී දැය හා සසඳා බලව එහි අපි අ අ දෙක ආ වේ යයි කීම්හ. තෙපි අපගේ බස සාවද්‍ය යයි කියව. තොප අපට නැඟුයේ නැති දොසෙකි. අප දුන් පිළිතුර බලග. එ නයින් අපට දොස් නො නැඟිය යුතු වේ. තොපගේ දෝෂාරෝපණය සාවද්‍යය. අප තොපට කළ දෝෂාරෝපණය නිරවද්‍ය වෙයි. අපගේ නිගමනය නිවැරදි වේ.

අට්ඨමුඛවාදයුත්ති:

කථාවස්තුයෙහි පුද්ගලකථාව පිළිබඳ පළමුවැනි සච්චිකට්ඨයෙහි එන සිව්වැදෑරුම් සච්චිකට්ඨයන් අතුරෙන් එකෙකි සච්චිකට්ඨයෙහි 'අනුලෝම පච්චනීක යැ, පච්චනීකානුලෝම' යැ යන පච්චනීකයන් දෙදෙනාගේ වශයෙන් **අට්ඨමුඛවාදයුත්ති** දක්වන ලදු. එහි ආකෘතිය මෙසේ යැ:

(1) පරමාර්ථ වශයෙන් පුද්ගල ඇද්ද? (පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමත්ථේන)

(2) හැම තන්හි පරමාර්ථවශයෙන් පුද්ගල ලැබේ ද? (සබ්බත්ථ පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමත්ථේන)

(3) (පූර්ව-පශ්චිමාදි) හැම කල්හි පරමාර්ථ වශයෙන් පුද්ගල ලැබේ ද? (සබ්බදා පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමත්ථේන)

(4) (පඤ්චඛන්ධ - ද්වාදසආයතන - අට්ඨාරසධාතු - බාවීසතීන්ද්‍රිය යන සත්පනස් ධර්ම සඞ්ඛ්‍යාත) හැම විෂයෙහි පරමාර්ථ වශයෙන් පුද්ගල ලැබේ ද? (සබ්බෙසු පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨ-පරමත්ථේන.)

මේ සතරෙහි එක්එක්හි නිග්‍රහ දෙකක් දෙකක් බැගින් ලැබෙන නිග්‍රහ අට 'අෂ්ටමුඛ නිග්‍රහ' නම් වෙයි. 'අට්ඨමුඛ වාදයුත්ති' යයි අටුවාහි කියන ලද්දේ එය මැ යි. පාළියෙහි **අට්ඨකනිග්ගහ** යයි ලියනු ලැබේ.

මෙය බෙදා ඇති සැටි විස්තර වශයෙන් මෙසේ ය:

1. (i) සුද්ධසච්චිකට්ඨයෙහි සකවාදී පක්ෂයෙන් ඇරැඹෙන ප්‍රථම නිග්‍රහකථාව වෙයි. **පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨ-පරමත්ථේන, යො සච්චිකට්ඨො පරමත්ථො තතො සො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමත්ථේන"** - 'පරමාර්ථ වශයෙන් පුද්ගල ඇද්ද?' යනාදිය ප්‍රශ්න යි. මෙහි සකවාදී පක්ෂයෙන් ඇරැඹෙන නිග්‍රහයෙහි අනුලෝමපඤ්චකාදි කොටස් පස වෙයි.

(ii) ඒ සුද්ධසච්චිකට්ඨයෙහි ම **"පුග්ගලො නූපලබ්භති සච්චිකට්ඨ-පරමත්ථෙන, යො සච්චිකට්ඨො පරමත්ථො තතො සො පුග්ගලො නූපලබ්භති සච්චිකට්ඨපරමත්ථෙන"** යි පරමාර්ථ විසින් පුද්ගල නැද්ද? යනාදීන් පරවාදී පක්ෂයෙන් ඇරඹෙන දෙවැනි නිග්‍රහය වෙයි. එහි පටිලොමපඤ්චකාදි කොටස් පස වෙයි.

(iii) **"පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමත්ථෙන සබ්බත්ථ පුග්ගලො උපලබ්භති"** යනාදීන් හැම තැන (හැම සිරුරෙක) පරමාර්ථ වශයෙන් පුද්ගල ඇද්ද? ආදි තෙවැනි නිග්‍රහ කථාව ද,

(iv) **"සබ්බදා පුග්ගලො උපලබ්භති"** යි හැම කල්හි (පූර්ව පශ්චිම ජාති කාලාදියෙහි) පරමාර්ථ වශයෙන් පුද්ගල ඇද්ද? යනාදි සිව්වැනි නිග්‍රහය ද,

(v) **"සබ්බෙසු පුග්ගලො උපලබ්භති"** යි සියල්ලෙහි (ස්කන්ධාදි සත්පනස් ප්‍රභෙද ධර්මයෙහි) පරමාර්ථ විසින් පුද්ගල ඇද්ද? යනාදි පස්වැනි නිග්‍රහය ද යන අනුලොමපඤ්චක නිග්‍රහකථා තුන ම සකවාදීපක්ෂයෙන් ඇරඹෙයි.

(vi) අනතුරුව **"සබ්බත්ථ පුග්ගලො නූපලබ්භති"** යි සියලු තන්හි පරමාර්ථ වශයෙන් පුද්ගල නැද්ද? යනාදි සවැනි නිග්‍රහය ද,

(vii) **"සබ්බදා පුග්ගලො නූපලබ්භති"** යි හැම කල්හි පුද්ගල පරමාර්ථ වශයෙන් නො ලැබේ ද? යනාදි සත්වැනි නිග්‍රහය ද,

(viii) **"සබ්බෙසු පුග්ගලො නූපලබ්භති"** යි හැම ධර්මවිෂයෙහි පරමාර්ථ වශයෙන් පුද්ගල නැද්ද? යනාදි අටවැනි නිග්‍රහ කථා ද යි අවසානයෙහි පච්චනිකානුලොම නිග්‍රහකථා තුන පරවාදී පක්ෂයෙන් ඇරඹෙයි. ඒ හැම තන්හි අනුලොම පඤ්චකාදි කොටස් පස යෙදෙන සේ සැලැකිය යුතු ය.

"එත්තාවතා සුද්ධිකස්ස චෙව ඉමෙසඤ්ච තිණ්ණන්නන්ති චතුන්නං සච්චි-කට්ඨානං එකෙකස්මිං සච්චිකට්ඨෙ අනුලොම පච්චනිකස්ස ච පච්චනිකානු-ලොමස්ස චාති ද්වින්නං ද්වින්නං පච්චනිකානං වසෙන අයං අට්ඨමුඛා නාම වාදයුත්ති නිද්දිට්ඨා හොති" යනු අටුවා යි. සුද්ධික-ඨාන-කාල-ඛන්ධාදි විසින් සිව්වැදෑරුම් සච්චිකට්ඨ (සත්‍යාර්ථ) යන් අතුරෙහි එකෙකි සච්චිකට්ඨයෙහි යෙදෙන අනුලොමපච්චනික යැ, පච්චනිකානුලොම යැ' යි දෙවැදෑරුම් පච්චනිකයන්ගේ වශයෙන් **අට්ඨමුඛවාදයුත්ති** දක්වන ලදු.

කථාවත්ථුයෙහි සූත්‍ර දහසෙක් ඇත:

"මොග්ගලිපුත්තතිස්සත්ථෙරො ... සත්ථාරා දින්ননයවසෙනෙව තථාගතෙන ඨපිතමාතිකං විභජන්තො සකවාදෙ පඤ්චසුත්තසතානි පරවාදෙ පඤ්චාති සුත්තසහස්සං ආහරිත්වා ඉමං ... කථාවත්ථුප්පකරණං අභාසි" යනු අටුවා යැ.

මොග්ගලිපුත්තතිස්ස තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසින් දී වදාළ නය වශයෙන් මැ තථාගතයන් තැබූ (කථාවත්ථු) මාතෘකාව විභාග කරමින් සකවාදයෙහි සූත්‍ර පන්සියෙක, පරවාදයෙහි සූත්‍ර පන්සියෙකැයි සූත්‍ර දහසක් ඇරගෙන මේ කථාවත්ථුප්‍රකරණය වදාළහ යනු එහි අදහසයි.

'සකවාදයෙහි පන්සියෙක පරවාදයෙහි පන්සියෙකැ' යි සූත්‍ර දහසක් එළවා කථාවත්‍ථු දෙසූහ. කථාවත්‍ථුයෙහි වාදකථා දෙසියසතළොසෙකි. ඇතැම් ලබ්ධියක් පිහිටුවාලන්නට පරවාදී පක්‍ෂයෙන් ද, එය විශොධනය සඳහා සකවාදී පක්‍ෂයෙන් ද ඉදිරිපත් කළ සාධකදෙශනාසූත්‍ර බොහෝ ගණනෙකි. කිසි විටෙක එක් මැ සූත්‍රය කිහිපතැන යෙදී ඇත. මෙසේ කථාවත්‍ථුප්‍රකරණයෙහි සූත්‍ර දහසෙක් ඇති සේ සැලැකිය යුතු ය.

කථාවත්‍ථුප්‍රකරණයෙහි අෂ්ටමාතෘකායෙක් ඇතැ' යි කෙනෙක් කියති. හෙ ද සනාථකොට නැත. **"තථාගතෙන ඨපිත මාතිකං"** යි කථාවත්‍ථු මාතෘකාව එකක් මැ බව මේ වාක්‍යයෙන් පැවසේ. අෂ්ටමාතෘකායෙක් වී නම්, **"තථාගතෙන ඨපිතාවට්ඨමාතිකායො"**යි බුහුබසින් පවසනු ඇත. කථාවත්‍ථු මාතෘකා කොහි වී යැ යත්: පුග්ගලපඤ්ඤත්ති මාතෘකා අවසනැ බණවරකට මඳක් අඩු පුද්ගල මාතෘකා ඇත. එ මැ කථාවත්‍ථුයෙහි මාතෘකා වී යයි සිතම්හ. "අයං අට්ඨමුඛා නාම වාදයුත්ති නිද්දිට්ඨා හොති"යි කථවත්‍ථුපප-කරණ පුග්ගලකථායෙහි මුලින් මැ එන වාදමුඛ අෂ්ටකය ගෙන කථාවත්‍ථු ප්‍රකරණයට අෂ්ටමාතෘකාවක් ඇතැ'යි ගත් සේ ද? විමසන්න!

බෞද්ධන්‍යාය:

කථාවත්‍ථු දේශනාවෙන් යට දැක්වූ පරිදි වාදයුක්ති = වාදන්‍යාය ඉදිරිපත් කරමින් ඒ ඒ නිකායවාසීන් තථාගතසමයවිරොධි කොට ගත් ලබ්ධි විශොධ-නය කොට ඇත. එහෙයින් පවිත්‍ර වූ බෞද්ධන්‍යායයෙක් ඇත් නම්, මේ කථාවත්‍ථුයෙහි එන වාදයුක්තික්‍රමය මැ යි. ජිනවචනානුයායී ස්ථවිරවාදයට විරොධී වැ සිටි **දිඞ්නාග**, **ධර්මකීර්ති**, **අසඞ්ග**, **වසුබන්ධු** ආදි කීර්තිමත් බෞද්ධ නෛයායිකයන් ඒ ඒ න්‍යායශාස්ත්‍ර නිපදවාලීමෙහි ප්‍රොත්සාහී වූයේ තමන් තමන් ගත් ලබ්ධිස්ථාන සනාථකිරීම සඳහා මැ ය. ඔවුනට ආදර්ශ වූයේත් උන් වාදෙන්මුඛ කොට යතාලූයේත් කථාවත්‍ථුප්‍රකරණය මැ යි. එහෙත් කථාවත්‍ථුයෙන් සකාරණ කොට ලබ්ධි විශෝධනය කළ ද, ඇතැම් නිකායන්තරවාදීහු කථාවත්‍ථු නො පිළිගත්හ. ස්වකීය දුර්ලබ්ධිය තර කිරීමට ම මඟ සෙවූහ. මේ විමසන්න:

අන්තරාභවකථා:

පූර්වශෛලීය-සම්මිතීය ඈදුරෝල්හි වූවෝ් අඞ්ගුත්තරනිකාය තිකනිපා-තයෙහි වදාළ "සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති" යන සූත්‍රපදය නුනුවණින් ගෙන 'අන්තරාභව-යෙක් ඇතැ'යි ද, මෙ ලොවින් නැවැ පරලොව ගිය සත්ත්වයා දිවැස් නැති වැ, දිවැස් ඇතියකු සෙයින් ද, ඍද්ධි නැති වැ ඍද්ධි ඇතියකු සෙයින් ද, මවුගේ ඍතුකාලය ද මවුපියන්ගේ සඞ්ගමය ද බලමින් සතියක් හෝ අතිරෙක සතියක් පමණ කල් සිටුනේ යී ද, මරණයත් මවුකුස පිළිසඳ ගැනුමත් අතර කාලය අන්තරාභව නමැයි ද කීහු.

'අන්තරාපරිනිබ්බායී පුද්ගලයෙක් ඇතැ'යි යන හේතුවින් අන්තරාභව-යක් ඇතිවත් මැ උපහච්චපරිනිබ්බායී ආදි පුද්ගලයනුදු ඇතියෙන් උපහච්චභවාදිය ද ඇති වියැයුතු යැ. පරවාදීන් එබඳු භවයක් ප්‍රතිඥ නො කරන හෙයිනුදු, කාමරූපාදි භවයන් අතුරෙහි අන්තරාභවයක් නැති හෙයිනුදු, කාමාදි තුන් භවයන් හැර සතරවැනි භවයන් නැති හෙයිනුදු, අන්තරාභවූපග කර්මයක් නැති හෙයිනුදු, හැම සත්නට අන්තරාභවයක්

නැති හෙයිනුදු, එ කියන අන්තරාභවයෙහි වේදනා සංඥාදිය නැති හෙයිනුදු, ජරාමරණ නැති හෙයිනුදු 'අන්තරාභවයෙක් නැතැ' යි කථාවස්තුයෙහි දී එ වාදය ඛණ්ඩනය කරනලද්දේ ය.

පසු වැ අන්තරාභවවාදීහු අන්තරාභවයෙක් ඇති මැ යයි දක්වන්නට තෙවළායෙන් සාධක සොයනුවෝ "තතො ත්වං බාහිය, නෙවිධ න හුරං න උභයමන්තරෙන" යන **උදානපාළි හැ** බාහිය සූත්‍රපාඨයෙහි එන "**උභය-මන්තරෙන**" යන පදය ද, "**භූතා වා සම්භවෙසී වා**" යන **සුත්තනිපාතයෙහි** කරණීයමෙත්තසූත්‍රපාඨය ද අර්ථ විපරීත කොට ප්‍රමාණ වශයෙන් ගත්හ. උදානපාළියට අටුවා ලියන භදන්ත **ධම්මපාලාචාරීන්** විසින් තථාගතානුමත වූ අර්ථකථා විවරණ කරමින් එයිනුදු 'අන්තරාභවයෙක් ඇති'යි නො වදාළ බව හෙළි කරනලද්දේ ය.

උදාන අටුවා සම්පාදනයෙන් කලකට පසු වැ සර්වාස්තිවාදී නිකායික වූ **වසුබන්ධු** නම් ආචාර්යවරයා අන්තරාභවවාදය තව තවත් තර කරමින් යට දැක්වූ සූත්‍ර හා **මැදුම්සඟි හැ** මහාතණ්හාසඞ්ඛය සූත්‍රයෙහි "මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති, මාතා ච උතුනී හොති, ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති" යි වදාළ තැන්හි '**ගන්ධබ්බො**' යනුයෙහි "**ගන්ධර්ව** = ගඳ අනුභව-කරන්නා-ගන්ධානුභවයට යන්නා" යි නිරුක්ති හෙයින් 'ගන්ධර්ව' නම් වූ යේ **අන්තරාභවික සත්ත්වයා** මැ යයි ගෙන **අභිධර්මකොෂ** යෙහි ලොකධාතු නිර්දේශයෙහි කාරිකා කිහිපයෙකින් අන්තරාභවවාදය නගාලී ය. එමතු ද? සංස්කාරප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධිවිඥානයාගේ සම්භවය දක්වනු සඳහා අටුවායෙහි වදාළ ප්‍රතිබිම්බොපමාව ද වසුබන්ධුන් විසින් බැහැර කරනලද්දේ ය. (ප්‍රතිබිම්බං අසිද්ධත්වාත් අසාම්‍යාච්චාතිදර්ශනම්.) එ ද අන්තරාභවවාදය තරකිරීමෙහි මඟක් වශයෙනි.

කථාවත්ථුයෙහි "අන්තරාභවෙ අත්ථි රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං" යි අන්තරාභවයෙහි රූප වෙදනා සංඥා සංස්කාර විඥාන ඇද්ද? යන සකවාදී (ස්ථවිරවාදී) ප්‍රශ්නයට 'නැති' (න හෙවං වත්තබ්බෙ) යි පරවාදී (නිකායන්තරවාදී) පිළිතුර විය. එහෙත් අභිධර්මකොෂයෙහි (අසා-වෙෂ්‍යත් පූර්වකාලභවාකෘතිඃ) 'අන්තරාභවිකයා පූර්වකාලභවයට සමාන ආකෘති දරයි ද, (සකලොක්ෂඃ) චක්ෂුරාදි සියලු ඉන්ද්‍රිය රූපයෙන් සංයුක්ත යයි ද, කියමින් පරවාදියා මුල දී බැහැර කළ කරුණු පසුව පිළිගෙන ඇති සැටි ද, 'අන්තරාභව උපපත්තිභව පූර්වකාලභව මරණභව' යි භව සතරක් නිර්මාණය කරමින් සද්ධර්මප්‍රතිරූප මවා ඇති සැටි ද විමැසියැයුතු ය.

නිරයපාලකථා:

"සකානි කම්මානි හනන්ති තත්ථ" යන නීතාර්ථ සූත්‍රපදය විපරීත කොට ගෙන, 'නිරයෙහි නිරයපාලයෝ නැති'යි ද, ස්වකීය 'නෙරයිකකර්මයෝ මැ නිරයපාලරූපයෙන් සිට නිරිසත්නට හිංසා කෙරෙති'යි ද **අන්ධකනිකාය වාසීහු** කියති. තිකඞ්ගුත්තර දේවදූත සූත්‍රයෙන් ද මජ්ඣිමනිකාය - උපරිපණ්ණාසක - මහාදේවදූත සූත්‍රයෙන් ද "තමෙනං භික්ඛවෙ නිරයපාලා පඤ්චවිධබන්ධනං නාම කාරණං කාරෙන්ති" යනාදි නෙයාර්ථ සූත්‍ර දක්වා කථාවත්ථුයෙහි දී ඒ නිරයපාලවාදය බැහැර කොට ඇත. එහෙත් පපඤ්ච-සූදනී මනොරථපූරණී අටුවා දෙක්හි මැ: "එකච්චෙ ථෙරා නිරයපාලා නාම නත්ථි, යන්තරූපං විය කම්මමෙව කාරණං කාරෙතීති වදන්ති. තං අත්ථි නිරයෙසු නිරයපාලාති, ආමන්තා, අත්ථි ච කාරණිකාති ආදිනා නයෙන

අභිධම්මෙ පටිසෙධිතමෙව'' සී මේ ආන්ධ්‍රකයන්ගේ වාදය ම ''එකචෙව ථෙරා'' සී ඒකත්‍යවාදයක් ලෙස දක්වන ලද්දේ ය. ආන්ධ්‍රක නිකාය සතරින් ඇතැම් ඇදුරොලෙක් ස්ථවිරවාදීන්ට සම්පව සිටියා වනැ'යි සිතියැ යුතු ය. ආන්ධ්‍රකවාදයක් වූ නිරයපාලකථාව සහිඅටුවාවට ආයේ එහෙයිනි. සමන්තපාසාදිකායෙහි ද බොහෝ තැනෙක අන්ධකයන්ගේ අටුවායෙන් නභාගත් කරුණු සඳහන් ව ඇති සැටි ද සැලැකියැ යුතු ය.

වාදයන්ට සම්බන්ධ නිකායාන්තරිකයෝ:

කථාවත්ථුප්‍රකරණයෙහි විශෝධනයට භාජන වූ දෙසියසතළොසක් වාදකථාවන් අතුරෙන් එක්සැත්තැවක් පමණ වාදගත්ට සම්බන්ධ වූවාහු යථොක්ත අන්ධක ඇදුරොලෙහි වූවෝ ය. පුබ්බසෙලීයාදි අන්ධක නිකායාන්තරිකයන් වෙන වෙන මැ උපදවාලූ වාදකථා ද ඇත. ඒ ඒ නිකායිකයන් තමන් තමන්ගේ ලබ්ධිවශයෙන් සම්බන්ධ වූ වාදකථා කථාවත්ථුඅටුවායෙහි සඳහන් ලත් පරිදි මෙසේ යැ:

1. අන්ධක	වාද	71	9. මහිංසාසක	වාද	9
2 උත්තරාපථක	,,	41	10. අපරසෙලීය	,,	5
3. මහාසංඝික	,,	32	11. වෙතුල්ලක	,,	3
4. පුබ්බසෙලීය	,,	27	12. සබ්බත්ථිවාදී	,,	2
5. සම්මිතිය	,,	25	13. වජ්ජිපුත්තක	,,	2
6. රාජගිරික	,,	10	14. කස්සපික	,,	1
7. සිද්ධත්ථික	,,	10	15. ගොකුලික	,,	1
8. හෙතුවාදී	,,	10	16. භද්‍රයානික	,,	1

මහායානසම්භවය:

අශෝකාධිරාජ්‍යයෙහි නිකායාන්තරිකයන්ගේ පක්ෂබල හීන වූයෙන් ඔහු ප්‍රත්‍යන්ත ජනපදයන් කරා එළැඹැ නිශශබ්දලෙශයෙන් කල් යැවූහ. ගන්ධාර දෙශයෙහි **පුරුෂපුරය** (පෙෂාවර්) ඔවුන්ගේ මධ්‍යස්ථානය විය. බුදුන් පිරිනිවි සවැනි සියවසෙහි **කණිෂ්කාධිරාජයා** දඹදිවැ ආධිපත්‍යයට පැමිණි කල්හි එ රජු පහදවාගත් ඔහු එ රජුගේ මැ ආරාධනායෙන් පන්සියක් භික්‍ෂූහු එක් වැ ගෙන **කුණ්ඩලවන** විහාරයෙහි සඞ්ගීතියක් කළහ. ඒ වූ කලී මහාසංඝිකාදි නිකායවාසීන් නිපදවාලූ ග්‍රන්ථයනට 'විභාෂා' නම් ටීකාග්‍රන්ථ සම්පාදනය කිරීමෙකි. එ විභාෂා ග්‍රන්ථයන් පිළිගත් හැම නිකායිකයෝ මැ එක් වැ ගෙන **වෛභාෂික** නම් එක් ඇදුරොලක්බවට ගියහ. ඔහු හැම බුදුබවට පැමිණීමෙන් මැ නිර්වාණාධිගමය කළයුතු යැයි ගෙන, තුමූ මැ **මහායාන** නම් වූහු. විභාෂා නො පිළිගත් නිකායාන්තර කිපයක් හා අසම්භින්න ස්ථවිරවාදය හා **හීනයාන** යි නම් කළහ. ඒ උන්ගේ මානමදයෙන් කළ ආරොපණ මාත්‍රයෙකි·

කල් යාදී වෛභාෂිකයෝ විවිධ ලබ්ධිහේතුයෙන් ම '**සර්වාස්තිවාදී** යැ, **සෞත්‍රාන්තික** යැ, **විඥානවාදී** යැ, **ශූන්‍යවාදී** යැයි කොටස් සතරකට බිඳීගියහ. ලබ්ධිවශයෙන් භින්න වුව ද ඔහු **නාලන්දා, වික්‍රමශිලා, ඔදන්තපුරී** ආදී ස්ථාන මූලායතන කොටගෙන මහායානිකයන් වශයෙන් එක් වැ විසූහ·

කථාවත්ථුයෙහි වාක්‍යප්‍රයෝග:

කථාවත්ථුප්‍රකරණය විභාග කරනලද්දේ බුදුන් පිරිනිවි තුන්වැනි සියවසෙහි යැ. මේ කාලාන්තරයෙහි පාළිමාගධිකව්‍යවහාරයෙහි දී ඇතැම් ශබ්දප්‍රයෝගයන්ගේ යම් යම් වෙනස්වීම් සිදු වූ බව පෙනේ. තත්කාලීන-ව්‍යවහාරයෙහි පැවැති අපුරු යෙදුණු ශබ්දප්‍රයෝග කථාවත්ථුයෙහි දක්ක හැකි ය. (මෙ ද කථාවත්ථුප්පකරණය රචනා කළ ග්‍රන්ථයක් නො ව මොග්ගලිපුත්තතිස්ස මහරහතුන් වහන්සේගේ දෙශනාවක් බවට සාධකයක් වෙයි.) එබඳු කිහිපතැනෙක් මෙසේ යැ:

සච්ඡිකට්ඨ:

මායා මරීචි ආදිය සෙයින් අභූත නො වූ, භූත වූ සත්‍ය වූ අර්ථය 'සච්චට්ඨ' යනු වේ. මේ අර්ථයෙහි 'සච්ඡිකට්ඨ' ශබ්දය ම කථාවත්ථුයෙහි බෙහෙවින් යෙදී ඇත.

න හෙවං වත්තබ්බෙ:

'න හි+එවං' යි විච්ඡේද යි. 'න හ එවං' යි හෝ වෙයි. 'හි' කිව ද, 'හ' කිව ද වාක්‍යපූරණයෙහි නිපාත යැ: 'එසේ නො කියැයුතු යැ' (න එවං වත්තබ්බො) යනු වේ.

වත්තබ්බෙ:

ලිඞ්ගාර්ථ එකත්වයෙහි 'ඕ' හට 'එ' වූ තැනි. සූත්‍රපාළියෙහිදු කිසිතැනෙක 'වනප්පගුම්බෙ ඵුස්සිතග්ගෙ' ආදියෙහි සෙයින් ඉතා විරල වැ මේ ප්‍රයෝගය ඇත ද කථාවත්ථුයෙහි 'නිග්ගහෙතබ්බෙ, දුන්නිග්ගහිතෙ, එකට්ඨෙ, තජ්ජාතෙ' ආදි විසින් මේ ප්‍රයෝගය බහුල වැ දක්නට ඇත.

හඤ්චි:

'සචේ' හෝ 'යදි' (ඉදින්) ශබ්දාර්ථයෙහි නිපාත යැ සූත්‍රපාළියෙහි දුර්ලභ වූ මේ අව්‍යයරූපය ද කථාවත්ථුයෙහි සුලභ වේ.

ආමන්තා:

ප්‍රතිඥායෙහි නිපාත යැ. අන් තන්හි 'ආම, ආමො, එවං' යි යෙදෙන ප්‍රතිජානනාර්ථය කථාවත්ථුයෙහි මේ යෙදෙන සැටි යි.

හෙවං:

මෙහි 'හ' කාර ආගමජ යි. 'එවං' යනු වේ. 'හෙවමෙවං, හෙතාය පටිඤ්ඤාය' ආදි අනෙකස්ථලයෙහි පදාදි වූ ආගමහකාරය කථාවත්ථු-පාළියෙහි ඇත.

එසෙ සෙ:

'එසො සො' (තෙලෙ හේ මැ වෙයි.) නොහොත් 'එසො එසො' (තෙලෙ තෙලෙ මැ ය.) 'එසො එසො යෙව' යනු වේ.

හෙවත්ථි:

මෙහි දු හකාර ආගම යැ. නිග්ගහීත ස්වරලොප යි. 'එවං අත්ථි' යනු වේ හෙම නත්ථි 'එවං නත්ථි' යනු වේ.

සෙවත්ථි සෙව නත්ථි:

'සො එව අත්ථි, සො එව නත්ථි' (හෙ මැ ඇත, හෙ මැ නැත) යනු වේ.

අත්ථට්ඨං නත්ථට්ඨං:

'අත්ථි සභාවෙං, නත්ථි සභාවො' අස්ත්‍යර්ථය නාස්ත්‍යර්ථය (ඇත යන සවභාව, නැත යන සවභාව) යනු වේ.

නොත්ථි නොතීතං:

'නො අත්ථි, නො අතීතං' යනු වේ.

කථාවත්ථුසංස්කරණය:

කථාවත්ථුප්පකරණය කිහිප වරෙක සංස්කරණයෙන් මුද්‍රණය වී ඇත. බුද්ධජයන්ති සමයෙහි බුරුමරට දී සිදු කළ ඡට්ඨසඞ්ගායනාවෙහුදු සංස්කරණය ලැබ මුද්‍රණය විය. මෙ වූ කලී නවීනතම සංස්කරණය විය හැකිය.

බුද්ධජයන්ති ත්‍රිපිටකපාළි සංස්කරණය නම්: ත්‍රිපිටක ග්‍රන්ථයන්හි දීර්ඝ-කාලාන්තරයෙහි ලේඛකදෝෂයෙන් ජනිත වූ අක්ෂර පද ව්‍යඤ්ජනයන් පිළිබඳ විපරීතතායෙක් වේ නම් එය බැහැර කොට, ත්‍රිවිධ සඞ්ගායනාවට නැඟිගිය ශුද්ධ වූ පාඨය මැ මතු කොට ගැනීම ය. මෙ කාර්‍ය්‍යයෙහි ප්‍රබල වූ විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි සම්මාන උපකුලපති පරවාහැර ශ්‍රී වජිරඤාණාභිධාන නාහිමිපාණන් වහන්සේගේ ප්‍රමුඛත්වය ඇති බුද්ධජයන්ති ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයෙන් කථාවත්ථුප්පකරණයේ සංස්කරණය සිද්ධ වී ඇත. මෙ සංස්කරණයෙන් ශුද්ධියට පත් පදපාඨ ඒ ඒ පිටුයෙහි පාඨාන්තර විසින් දක්වා ඇතියෙන් වෙන මැ සඳහන් නො කළ මනා යැ.

කථාවස්තුප්‍රකරණය තථාගතභාෂිතය පිළිබඳ පරවාදමර්ථනය සඳහා වාද ප්‍රතිවාදලේශයෙන් වදාරනලද්දෙකි. එහෙයින් එහි ප්‍රණීත වූ න්‍යායමාර්ගයෙකුදු ඇත. (එය මෙහි මුල දී සැකෙවින් දක්විණි.) ග්‍රන්ථලාඝවය සඳහා ප්‍රශ්න දෙකක් තබා ප්‍රකරණය මුළුල්ල පෙය්‍යාලමුඛයෙන් සඞ්ග්‍රහ වී ඇත. මෙසේ එහි කථාමාර්ගය අතිශයින් දුරවබෝධය. මේ සංස්කරණයෙහි ලා හැම කථා මාර්ගයෙක මැ සකවාදී පරවාදී දෙ පක්ෂය ද, ඒ ඒ පක්ෂයෙහි පුච්ඡා පටිජානනා (පටිඤ්ඤා) අනුයොග පටිකෙඛප හා අනුලොම පටිලොම විසින් සිටි ඨපනා පාපනා ආරොපනා හා නිග්ගහ ද වෙන් කොට දක්වෙයි. පුග්ගලකථාදී එක් එක් කථායෙහි බැසගෙන සිටි ප්‍රශ්න වෙන් කොට දක්වනු සඳහා අනුක්‍රමයෙන් අඞ්ක යොදා ඇත. එක් එක් අඞ්කය තුළ 'සකවාදී පුච්ඡා' 'පරවාදී පටිඤ්ඤා' ආදිය පිළිබඳ සංකේත පද ද පෙළ ඉදිරියෙහි යෙදිණ. ඒ ඒ පිටුවෙහි දකුණු පසින් දේශනා පාළිය ද, හැම පාළි පිටුවක් ඉදිරිපිට යට කී ලෙසින් සංලක්ෂිත වූ සිංහල පරිවර්තනය ද යොදා ඇත.

සිංහල පරිවර්තනය:

බුද්ධජයන්ති උත්සව අනුස්මරණය සඳහා ලංකාරාජ්‍යය විසින් සම්මත වූ විශිෂ්ටතම කාර්‍ය්‍යය වූයේ ත්‍රිපිටකය සිංහල භාෂාවට නගාලීම යි. ත්‍රිපිටකයෙහි ඇතැම් ග්‍රන්ථයෙක් නොයෙක්වර සන්න පිටපත් හා පරිවර්තන ද්වාරයෙන් නොයෙක් ලෙසින් සිංහලට නැගී ඇත ද, ඇතැම් ග්‍රන්ථයෙක් එබඳු පරිවර්තනයකට කිසිකලෙක භාජන වී නැත. කථාවස්තුප්‍රකරණය ද එබඳු ග්‍රන්ථයෙකි. එයට අටුවා ටීකා අනුටීකා ඇත ද එ හැම ඉතා සංක්ෂිප්ත යැ. පෙළ විසින් ද කථාවස්තුප්‍රකරණය දුර්බෝධ යැ. එය පරිවර්තනය සඳහා **ලංකාබෞද්ධමණ්ඩලය** විසින් ආරාධිත වූවෝ ශ්‍රී ලංකා දක්ෂිණදිශාභාගයෙහි ප්‍රධාන සංඝනායක තන් පැමිණියෝ යැ. ව්‍යාකරණ ඡන්දෝලංකාරතර්කන්‍යායෙතිහාස සහිත ප්‍රාචීන භාෂා විෂයෙහි පණ්ඩිතොපාධිය අයත්නයෙන් හිමිකරගතුවහ. ලක්දිව වැ එත්මත් පඬිරුවන්වැලෙහි තරලමිණි වූවහ. ලේඛකයන් කෙරෙහි අග්‍රෙසර ව්‍යක්ත වාදීවූ, අහංගම **විද්‍යාචන්ද්‍ර** පිරුවන් හිමියෝ ය. ඔබ **කෝදාගොඩ ශ්‍රී ඥානාලෝකාභිධාන** මහාස්ථවිරයන් වහන්සේ යි.

කථාවස්තුප්‍රකරණයෙහි සිංහල පරිවර්තනය සරල යැ, සුගම යැ. සිංහල සාහිත්‍යතරුවරයෙහි අරුත්රස වැහෙන නවතම අමාඵලයෙකි. කථාවස්තු කොටාරෙහි සැඟැ වී සිටි අරුත්රුවන් පහයන මිණිපහනක් බඳු යි. එය ධර්මකාමීනට සගපවග නැඟුමට හිණිපෙතෙක් වේවයි අපගේ ආශංසනය වේ.

කථාවස්තු පිළිබඳ මේ සංඥපන සංලක්ෂණ සම්පාදනයෙහි දී අග්ගමහාපණ්ඩිත **බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය** මහානායකස්ථවිරපාදයන් වහන්සේ අපට උපස්තම්භක වැ සිටි බව ද, පණ්ඩිත **කරහම්පිටිගොඩ සුමනසාර** ස්ථවිරයන් වහන්සේ ඇතැම් කරුණු සංසන්දනායෙහි සහාය වූ බව ද මෙහි ලා පවසම්හ.

ලබුගම ලංකානන්ද ස්ථවිර.

බුද්ධවර්ෂ 2511.
ප්‍රවචනෝදය පිරිවෙන,
මොල්ලිගොඩ,
වාද්දුව.

සඞ්කේත නිරූපණය

[ග්‍රන්ථයෙහි යෙදී ඇති සඞ්කේත]

ස. පු:	...	සකවාදී පුච්ඡා,
ප. පටිඤ්ඤා:	...	පරවාදී පටිඤ්ඤා,
ස. අනු:	...	සකවාදී අනුයොගො,
ප. පටි:	...	පරවාදී පටික්ඛෙපො,
ප. පු:	...	පරවාදී පුච්ඡා,
ස. පටිඤ්ඤා:	...	සකවාදී පටිඤ්ඤා:
ප. අනු:	...	පරවාදී අනුයොගො,
ස. පටි:	...	සකවාදී පටික්ඛෙපො,
අනු. ඨ:	...	අනුලොම ඨපනා,
අනු. පා:	...	අනුලොම පාපනා,
අනු. ආ:	...	අනුලොම ආරොපනා,
පටි. ඨ:	...	පටිලොම ඨපනා,
පටි. පා:	...	පටිලොම පාපනා,
පටි. ආ:	...	පටිලොම ආරොපනා,
ස. නි:	...	සකවාදී නිග්ගහො,
ප. නි:	...	පරවාදී නිග්ගහො,
ස. නිග:	...	සකවාදී නිගමනං,
ප. නිග:	...	පරවාදී නිගමනං,
ස. වි:	...	සකවාදී විස්සජ්ජනා,
ප. වි:	...	පරවාදී විස්සජ්ජනා.

පොත්ථක සඞ්කේත

සී. මු:	...	සීහළක්ඛර - මුද්දිත පොත්ථකං,
සියා:	...	සියාමක්ඛර - මුද්දිත පොත්ථකං,
මජසං:	...	මරම්මඡට්ඨසඞ්ගීතිපිටක - පොත්ථකං,
PTS.	....	Pali Text Society Edition.

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS.

VOWELS

අa ආā ඉi ඊī උu ඌū එē ඔō

CONSONANTS

	කka	ඛkha	ගga	ඝgha	ඞṅa		
	චca	ඡcha	ජja	ඣjha	ඤña		
	ටṭa	ඨṭha	ඩḍa	ඪḍha	ණṇa		
	තta	ථtha	දda	ධdha	නna		
	පpa	ඵpha	බba	භbha	මma		
යya	රra	ලla	වva	සsa	හha	ළḷa	අංṃ

කka	කාkā	කිki	කීkī	කුku	කූkū	කෙkē	කොkō
ඛkha	ඛාkhā	ඛිkhi	ඛීkhī	ඛුkhu	ඛූkhū	ඛෙkhe	ඛොkhō
ගgā	=	=	=	=	=	=	=

Conjunct - Consonants

කකkka	ඤඤñña	ත්‍රtra	මඵmpha
කඛkkha	ණ්හṇha	දදdda	මබ,ඹmba
ක්‍යkya	ඤචñca	දධddha	මභmbha
ක්‍රිkri	ඤ්ඡ,ඡñcha	ද්‍රdra	මමmma
ක්වkva	ඤ්ජ,ජñja	ද්ව,වdva	මහmha
ඛ්‍යkhva	ඤඣñjha	ධ්වdhva	ය්‍ය,යයyya
ඛවkhya	ටටṭṭa	නතnta	යහyha
ගගgga	ටඨ,ඨṭṭha	නථntha	ලලlla
ගඝggha	ඩඩḍḍa	නදnda	ල්‍යlya
ඞකṅka	ඩඪḍḍha	නධndha	ලහlha
ග්‍රgra	ණණṇṇa	නනnna	වහwha
ඞඛṅkha	ණටṇṭa	නහnha	සසssa
ඞගṅga	ණඨṇṭha	පපppa	සමsma
ඞඝṅgha	ණඩ,ඩṇḍa	පඵppha	සවsva
චචcca	ණහṇha	බබbba	හමhma
චඡccha	තතtta	බභbbha	හවhva
ජජjja	තථttha	බ්‍රbra	ළහḷha
ජඣjjha	ත්වtva	මපmpa	

ා ā ි i ී ī ු ු u ූ ූ ū ෙ e ො ō

අභිධම්මපිටකෙ

කථාවත්ථුප්පකරණපාළියා

පඨමභාග – විසයසූචි

විසයා				පිට්ඨඞ්කා
	පඨමො වග්ගො			**2 – 422**
1.	පුග්ගලකථා	...	...	2 – 188
2.	පරිහානිකථා	...	...	190 – 250
3.	බ්‍රහ්මචරියකථා	...	...	152 – 274
4.	ඔධිසොකථා	...	...	276 – 288
5.	ජහතිකථා	...	...	290 – 302
6.	සබ්බත්ථිකථා	...	...	304 – 372
7.	අතීතඛන්ධාදිකථා	...	..	374 – 390
8.	එකච්චං අත්ථීතිකථා	...	...	392 – 402
9.	සතිපට්ඨානකථා	...	...	404 – 412
10	හෙවත්ථිකථා	...	...	414 – 422
	මහාවග්ගො නිට්ඨිතො			
	දුතියො වග්ගො			**424 – 578**
11.	පරූපහාරකථා	...	...	424 – 444
12.	අඤ්ඤාණකථා	...	...	446 – 462
13.	කඞ්ඛාකථා	...	...	464 – 478
14.	පරවිතරණකථා	...	...	480 – 496
15.	වචීභෙදකථා	...	...	498 – 518
16.	දුක්ඛාහාරකථා	...	...	520 –
17.	චිත්තට්ඨිතිකථා	...	...	522 – 530
18	කුක්කුළකථා	...	...	532 – 540
19.	අනුපුබ්බාභිසමයකථා	...	...	542 – 560
20.	වොහාරකථා	...	...	562 – 572
21.	නිරොධකථා	...	...	574 – 578

දුතියො වග්ගො නිට්ඨිතො.

අභිධම්මපිටකෙ

කථාවත්ථුප්පකරණං

පඨමො භාගො

අභිධම්මපිටකෙ

කථාවත්ථුප්පකරණං

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

පඨමො වග්ගො

1. 1.

පුග්ගලකථා

1. සකවාදීපුච්ඡා: පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමත්ථෙනා'ති.[1]

පරවාදීපටිඤ්ඤා: ආමන්තා.

සකවාදීඅනුයොගො: යො සච්චිකට්ඨො පරමත්ථො[2] තතො සො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමත්ථෙනා'ති.[1]

පරවාදීපටික්ඛෙපො: නහෙවං වත්තබ්බෙ.

සකවාදීනිග්ගහො: ආජානාහි නිග්ගහං.

---

1 සච්චිකට්ඨපරමත්ථෙනාති - සයා

2. සච්චිකට්ඨො පරමත්ථො - සයා

අභිධර්මපිටකයෙහි

කථාවස්තුප්‍රකරණය

ඒ භගවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.

ප්‍රථම වර්ගය

1. 1

පුද්ගලකථා

[අප බුදුන් පිරිනිවි දෙවන සියවසෙහි ‘ථේරවාද’යෙන් බිඳීගිය ‘වජ්ජිපුත්තක’ නම් ඇදුරොලෙකෑ, තත්ප්‍රභව වූ ‘සම්මිතිය’ නම් ඇදුරොලෙකෑ යි ඇදුරොල්හු දෙදෙනෙක් වූහ. ඔහු බුදුන් විසින් “අත්ථිපුග්ගලො අත්තහිතාය පටිපන්නො” යනාදීන් සම්මතසත්‍ය විසින් සඞ්කෙතවචනයෙන් වදාළ සූත්‍රප්‍රදේශයෙහි අර්ථ වරදවා ගෙන භූතාර්ථයෙන් පුද්ගලයෙක් සත්ත්වයෙක් ඇති’යි අභිනිවෙශ කොට ජලචන්ද්‍රන්‍යායයෙන් විපරීතග්‍රාහ ඇති වූහ. සප්‍රත්‍යය – අප්‍රත්‍යාදි විසින් විභක්ත සප්තපඤ්චාශත් ස්කන්ධායතනධාතු ආදි ධර්මප්‍රභෙදමාත්‍ර වත් මුත් යථාර්ථයෙන් පුද්ගලයෙකු නැතියෙන් උන්ගේ ජලවාදයට අවකාශ නො දෙනු සඳහා පළමු මෑ තෙල “පුද්ගලකථා” ආරබ්ධ යි.]

1. සකවාදීපුච්ඡා: සත්‍යාර්ථ (=භූතාර්ථ) පරමාර්ථ (=ආත්මප්‍රත්‍යක්ෂ සඞ්ඛ්‍යාත උත්තමාර්ථ) වශයෙන් පුද්ගලයෙක් (=ආත්මයෙක්,) උපලභ්‍යමාන වේ ද? (නුවණ එළවා දත්නා ලැබේ ද?)

පරවාදීපටිඤ්ඤා: එසේ ය.

සකවාදීඅනුයෝග: යම් (ස්කන්ධ – ආයතන – ධාතු – ඉන්ද්‍රිය විසින් ඇති සත්පනස් ප්‍රභෙද වූ) සත්‍යාර්ථයෙක් පරමාර්ථයෙක් වේ ද, ඒ හේතුවිත් සත්‍යාර්ථ පරමාර්ථ ධර්ම වශයෙන් ඒ පුද්ගල දත්නා ලැබේ ද? (සත්පනස් ධර්මයන් කෙරෙහි රූපාදීන්ගේ රූපනාදි ආකාර-යෙන් දක්නා සත්‍යාර්ථ පරමාර්ථයෙක් ඇත් ද? තොප කියන පුද්ගලත් ඒ ආකාරයෙන් ලැබේ ද?)

පරවාදීපටික්ඛෙප: එසේ නො කියයුතු ය.

සකවාදීනිග්ගහ: නිග්‍රහය පිළිගනුව.

අනුලෝමඨපනා: හඤ්චි පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙන,

අනුලෝමපාපනා: තෙන වත රෙ වත්තබ්බෙ යො සච්චිකට්ඨො–පරමට්ඨො[1] තතො සො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙනා'ති.

අනුලෝම ආරෝපනා: යං තත්ථ වදෙසි: වත්තබ්බෙ ඛො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙන, නො ච වත්තබ්බෙ යො සච්චිකට්ඨො පරමට්ඨො තතො සො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙ–නා'ති මිච්ඡා.

පටිලෝමඨපනා: නො චෙ පන වත්තබ්බෙ යො සච්චිකට්ඨො පරමට්ඨො තතො සො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙනා'ති

පටිලෝමපාපනා: නො ච වත රෙ වත්තබ්බෙ පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙනා'ති.

පටිලෝම ආරෝපනා: යං තත්ථ වදෙසි: වත්තබ්බෙ ඛො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙන, නො ච වත්තබ්බෙ යො සච්චිකට්ඨො පරමට්ඨො තතො සො පුග්ගලො උපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙ–නා'ති මිච්ඡා.

අනුලෝම පඤ්චකං.

2. පරවාදීපුච්ඡා: පුග්ගලො නූපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙනා'ති[2]

සකවාදීපටිඤ්ඤා: ආමන්තා.

පරවාදීඅනුයොගො: යො සච්චිකට්ඨො පරමට්ඨො තතො සො පුග්ගලො නූපලබ්භති සච්චිකට්ඨපරමට්ඨෙනා'ති?

ස. පටික්ඛෙපො: නහෙවං වත්තබ්බෙ.

පරවාදීපටිකම්මං: ආජානාහි පටිකම්මං.

---

1. සම්මිකට්ඨො පරමට්ඨො - සතා.
2. සම්මිකට්ඨපරමට්ඨෙනාති - සතා.

අනුලෝමඨපනා: ඉදින් සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් පුද්ගල දන්නා ලැබේ නම්,

අනුලෝමපාපනා: භවත, එහෙයින් (තොප විසින්) යම් සත්‍යාර්ථයෙක් පරමාර්ථයෙක් වේ ද, එ සත්‍යාර්ථ පරමාර්ථ ධම් වශයෙන් එ පුද්ගල දන්නා ලැබේ යැ යි කියැයුතු මැ යැ.

අනුලෝම ආරෝපනා: සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් පුද්ගල දන්නා ලැබේ යැ යි කියැයුතු යැ යි ද, යම් සත්‍යාර්ථයෙක් පරමාර්ථයෙක් වේ ද, ඒ සත්‍යාර්ථ පරමාර්ථ ධම් වශයෙන් එ පුද්ගල දන්නා ලැබේ යැ යි නො කියැයුතු යැ යි ද යන යම් බසක් එහි ලා කියෙහි නම් මෙ තොපගේ මිථ්‍යායෙකි.

පටිලෝමඨපනා. යම් සත්‍යාර්ථයෙක් පරමාර්ථයෙක් වේ ද, එ සත්‍යාර්ථ පරමාර්ථ ධම් වශයෙන් එ පුද්ගල දන්නා ලැබේ යැ යි ඉදින් නො කියැයුතු නම්, භවත, (තොප විසින්) සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් පුද්ගල දන්නා ලැබේ යැ යි නො ද කියැයුතු මැ යැ.

පටිලෝමපාපනා: සත්‍යාර්ථ පරමාර්ථ වශයෙන් පුද්ගල දන්නා ලැබේ යැ යි ද,

ප පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ. ඉදින් රහත්හට රාගය කාමරාගය කාමරාග-පර්‍ය්‍යුත්ථානය කාමරාගසංයෝජනය කාමෞඝය කාමයෝගය කාමච්ඡන්දනීවරණය නැත් නම්,

අනු. පා: භවත, ‘රහත්හට ශුක්‍රවිසෘෂ්ටි ඇති’යි නො කියැයුතු මැ යැ.

3. ස. පු: පුහුදුන් පුහුල්හට ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද? ඔහට රාගය කාමරාගය කාමරාගපර්‍ය්‍යුත්ථානය කාමරාග සංයෝජනය කාමෞඝය කාමයෝගය කාමච්ඡන්ද-නීවරණය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද? ඔබට රාගය කාමරාගය කාමරාගපර්‍ය්‍යුත්ථානය … කාමච්ඡන්ද-නීවරණය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ …

4. ස. පු: රහත්හට ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද? ඔබට රාගය කාමරාගය කාමරාගපර්‍ය්‍යුත්ථානය … කාමච්ඡන්ද-නීවරණය නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පුහුදුන්හට ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද? ඔහුට රාගය කාමරාගය කාමරාගපර්‍ය්‍යුත්ථානය … කාමච්ඡන්ද-නීවරණය නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ …

5. ස. පු:	අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
ස. පු:	කෙනට්ඨෙනා'ති.
ප. වි:	හන්ද හි මාරකායිකා දෙවතා අරහතො අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්තී'ති.
ස. පු:	මාරකායිකා දෙවතා අරහතො අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්තී'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
ස. අනු:	අත්ථි මාරකායිකානං දෙවතානං අසුචි සුක්ක-විස්සට්ඨී'ති.
ප. පටි:	න හෙවං වත්තබ්බෙ -පෙ-
ස. පු:	නත්ථි මාරකායිකානං දෙවතානං අසුචි සුක්ක-විස්සට්ඨී'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
අනු. ඨ:	හඤ්චි නත්ථි මාරකායිකානං දෙවතානං අසුචි සුක්කවිස්සට්ඨී,
අනු. පා:	නො ච වත[1] රෙ වත්තබ්බෙ: 'මාරකායිකා, දෙවතා[2] අරහතො අසුචිං සුක්කවිස්සට්ඨිං උපසං-හරන්තී'ති.
6. ස. පු:	මාරකායිකා දෙවතා අරහතො අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්තී'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
ස. අනු:	මාරකායිකා දෙවතා අත්තනො අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්ති, අඤ්ඤෙසං අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්ති, තස්ස අසුචිං සුක්කවිස්සට්ඨිං උපසං-හරන්තී'ති.
ප. පටි:	න හෙවං වත්තබ්බෙ -පෙ-
7. ස. පු:	මාරකායිකා දෙවතා නෙව අත්තනො න අඤ්ඤෙ-සං න තස්ස අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්තී'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
අනු. ඨ:	හඤ්චි මාරකායිකා දෙවතා නෙව අත්තනො න අඤ්ඤෙසං න තස්ස අසුචිං සුක්කවිස්සට්ඨිං උපසං-හරන්ති,
අනු. පා:	නො ච වත රෙ වත්තබ්බෙ: "මාරකායිකා දෙවතා අරහතො අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්තී"ති.

1. නො වත - PTS.
2. මාරකායිකානං දෙවතානං PTS

5. ස. පු:	රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. පු:	කිනම් අර්ථයෙකින?
ප. වි·	මාරකායික දෙවියෝ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය එළවා ලති.
ස. පු:	මාරකායික දෙවියෝ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය එළවාලත් ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	මාරකායික දෙවියනට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?
ප. පටි:	එසේ නො කියැයුතු මැ යැ ...
ස. පු:	මාරකායික දෙවියනට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය නැද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
අනු. ඨ:	ඉදින් මාරකායික දෙවියනට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය නැත් නම්,
අනු. පා:	භවත, 'මාරකායික දෙවියෝ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි එළවාලති' යනු නො කියැයුතු මැ යැ.
6. ස. පු:	මාරකායික දෙවියෝ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි එළවාලත් ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	මාරකායික දෙවියෝ තමන්ගේ අශුචි ශුක්‍රවිසෘෂ්ටි එළවාලත් ද? මෙරමාගේ අශුචි ශුක්‍රවිසෘෂ්ටි එළවා-ලත් ද? ඔහුගේ අශුචි ශුක්‍රවිසෘෂ්ටි එළවාලත් ද?
ප. පටි:	එසේ නො කියැයුතු මැ යැ ...
7. ස. පු:	මාරකායික දෙවියෝ තමන්ගේ ශුක්‍රවිසෘෂ්ටි නො එළවාලත් ද? මෙරමාගේ ශුක්‍රවිසෘෂ්ටි නො එළවාලත් ද? ඔහුගේ අශුචි ශුක්‍රවිසෘෂ්ටි නො එළවාලත් ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ. (නිර්මාණ කොට එළවති යනු සිත තබා පිළින කෙරෙති.)
අනු. ඨ:	ඉදින් මාරකායික දෙවියෝ තමන්ගේ ශුක්‍ර නො එළවත් නම් මෙරමාගේ ශුක්‍ර නො එළවත් නම් ඔහුගේ අශුචි ශුක්‍රවිසෘෂ්ටි නො එළවත් නම්,
අනු. පා:	භවත, 'මාරකායික දෙවියෝ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි එළවාලති' යනු නො කියැයුතු මැ යැ.

8. ස. පු: මාරකායිකා දේවතා අරහතො අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ලොමකූපෙහි උපසංහරන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: මාරකායිකා දේවතා අරහතො අසුචිං සුක්කවිස්සට්ඨිං උපසංහරන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පු: කිං කාරණා'ති.

ප. වි: හන්ද හි විමතිං ගාහයිස්සාමා'ති.

ස. අනු: අත්ථි අරහතො විමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: අත්ථි අරහතො විමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො සත්ථරි විමති, ධම්මෙ විමති, සඞ්ඝෙ විමති, සික්ඛාය විමති, පුබ්බන්තෙ විමති, අපරන්තෙ විමති, පුබ්බන්තාපරන්තෙ විමති, ඉදප්පච්චයතා-පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු විමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: නත්ථි අරහතො සත්ථරි විමති, ධම්මෙ විමති, සඞ්ඝෙ විමති, සික්ඛාය විමති, පුබ්බන්තෙ විමති, අපරන්තෙ විමති, පුබ්බන්තාපරන්තෙ විමති, ඉදප්පච්චයතා-පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු විමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඡ: හඤ්චි නත්ථි අරහතො සත්ථරි විමති -පෙ- ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු විමති,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: "අත්ථි අරහතො විමතී"ති.

12. ස. පු: අත්ථි පුථුජ්ජනස්ස විමති, අත්ථි තස්ස සත්ථරි විමති -පෙ- ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු විමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

8. ස. පු: මාරකායික දෙවියෝ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි එළවාලත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ලොමකූපයෙන් එළවාලත් ද?

ප. පටි: එසේ නො කියයුතු මැ යැ ...

9. ස. පු: මාරකායික දෙවියෝ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි එළවාලත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පු: කවර කරුණින.

ප. වි: 'විමති ගත්වම්හ'යි.

ස. අනු: රහත්හට විමති ඇද්ද?

ප. පටි: එසේ නො කියයුතු මැ යැ ...

10. ස. පු: රහත්හට විමති ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට ශාස්තෘන් කෙරෙහි විමති ඇද්ද? දහමෙහි විමති ඇද්ද? සඟුන් කෙරෙහි විමති ඇද්ද? ශික්ෂායෙහි විමති ඇද්ද? පූර්වාන්තයෙහි විමති ඇද්ද? අපරාන්තයෙහි විමති ඇද්ද? පූර්වාන්තාපරාන්තයෙහි විමති ඇද්ද? ඉදම්ප්‍රත්‍ය-යතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෙහි විමති ඇද්ද?

ප. පටි: එසේ නො කියයුතු මැ යැ ...

11. ස. පු: රහත්හට ශාස්තෘන් කෙරෙහි විමති නැද්ද? දහමෙහි විමති නැද්ද? සඟුන් කෙරෙහි විමති නැද්ද? ශික්ෂායෙහි විමති නැද්ද? පූර්වාන්තයෙහි විමති නැද්ද? අපරාන්තයෙහි විමති නැද්ද? පූර්වාන්තාපරාන්තයෙහි විමති නැද්ද? ඉදම්ප්‍රත්‍ය-යතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයෙහි විමති නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් රහත්හට ශාස්තෘන් කෙරෙහි විමති නැත් නම් ... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයෙහි විමති නැත් නම්,

අනු. පා: භවත, 'රහත්හට විමති ඇත' යනු නො කියයුතු මැ යැ.

12. ස. පු: පුහුදුනට විමති ඇද්ද? ඔහුට ශාස්තෘන් කෙරෙහි විමති ඇද්ද? ... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයෙහි විමති ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු:	අත්ථි අරහතො විමති, අත්ථි තස්ස සත්ථරි විමති -පෙ- ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු විමතී'ති.
ප. පටි:	න හෙවං වත්තබ්බෙ -පෙ-
13. ස. පු:	අත්ථි අරහතො විමති, නත්ථි තස්ස සත්ථරි විමති -පෙ- ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු විමතී'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
ස. අනු:	අත්ථි පුථුජ්ජනස්ස විමති, නත්ථි තස්ස සත්ථරි විමති -පෙ- ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු විමතී'ති.
ප. පටි:	න හෙවං වත්තබ්බෙ.
14. ස. පු:	අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
ස. පු:	අරහතො අසුචි සුක්කවිස්සට්ඨි කිස්ස නිස්සන්දෙ'ති.
ප. වි:	අසිතපීතඛායිතසායිතස්ස නිස්සන්දෙ'ති.
ස. පු:	අරහතො අසුචි සුක්කවිස්සට්ඨි අසිතපීතඛායිත-සායිතස්ස නිස්සන්දෙ'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
ස. අනු:	යෙ කෙචි අසන්ති පිවන්ති ඛාදන්ති[1] සායන්ති, සබ්බෙසඤ්ඤෙව අත්ථි අසුචි සුක්කවිස්සට්ඨී'ති.
ප. පටි:	න හෙවං වත්තබ්බෙ -පෙ-
15. ස. පු:	යෙ කෙචි අසන්ති පිවන්ති ඛාදන්ති සායන්ති, සබ්බෙසඤ්ඤෙව අත්ථි අසුචි සුක්කවිස්සට්ඨී'ති.
ප. පටිඤ්ඤා:	ආමන්තා.
ස. අනු:	දාරකා අසන්ති පිවන්ති ඛාදන්ති සායන්ති, අත්ථි දාරකානං අසුචි සුක්කවිස්සට්ඨී'ති.
ප. පටි:	න හෙවං වත්තබ්බෙ -පෙ-
ස අනු:	පණ්ඩකා අසන්ති පිවන්ති ඛාදන්ති සායන්ති, අත්ථි පණ්ඩකානං අසුචි සුක්කවිස්සට්ඨී'ති.
ප. පටි:	න හෙවං වත්තබ්බෙ -පෙ-
ස. අනු:	දෙවා අසන්ති පිවන්ති ඛාදන්ති[1] සායන්ති, අත්ථි දෙවානං අසුචි සුක්කවිස්සට්ඨී'ති.
ප. පටි:	න හෙවං වත්තබ්බෙ -පෙ-

1. ඛායන්ති - PTS.

ස. අනු: රහත්හට විමති ඇද්ද? ඔහුට ශාස්තෲන් කෙරෙහි විමති ඇද්ද? ... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයෙහි විමති ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

13. ස. පු: රහත්හට විමති ඇද්ද? ඔහුට ශාස්තෲන් කෙරෙහි විමති නැද්ද?... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍ය සමුත්පන්න-ධර්මයෙහි විමති නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පුහුදුනට විමති ඇද්ද? ඔහුට ශාස්තෲන් කෙරෙහි විමති නැද්ද? .. ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න-ධර්මයෙහි විමති නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

14. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසර්‍ජනය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසර්‍ජනය කුමක්හුගේ විපාක-යෙක් වේ ද?

ප. වි: අසිත පීත ඛායිත සායිතයන්ගේ විපාක යැ.

ස. පු: රහත්හට වන අශුචි ශුක්‍රවිසර්‍ජනය අසිත පීත ඛායිත සායිතයන්ගේ විපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: යම් කෙනෙක් භොජ්‍ය විසින් වළඳත් ද, පෙය විසින් බොත් ද, ඛාද්‍ය විසින් කත් ද, ලෙය විසින් ආස්වාද කෙරෙත් ද, එ හැමට මැ අශුචි ශුක්‍ර-විසර්‍ජනය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු මැ යැ ...

15. ස. පු: යම් කෙනෙක් අසන පිවන ඛාදන සායන කෙරෙත් ද, එ හැමට මැ අශුචි ශුක්‍රවිසර්‍ජනය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දරුවෝ අසන පිවන ඛාදන සායන කෙරෙති, ඒ දරුවනට අශුචි ශුක්‍රවිසර්‍ජනය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

ස. අනු: පණ්ඩකයෝ අසන පිවන ඛාදන සායන කෙරෙති, ඒ පණ්ඩකයනට අශුචි ශුක්‍රවිසර්‍ජනය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

ස. අනු: දෙවියෝ අසන පිවන ඛාදන සායන කෙරෙත්. ඒ දෙවියනට අශුචි ශුක්‍රවිසර්‍ජනය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

16. ස. පු. අරහතො අසුචි සුක්කවිස්සට්ඨි අසිතපීතඛායිතසායිතස්ස නිස්සන්දො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි තස්ස ආසයො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

17. ස. පු: අරහතො උච්චාරපස්සාවො අසිතපීතඛායිතසායිතස්ස නිස්සන්දො, අත්ථි තස්ස ආසයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහතො අසුචි සුක්කවිස්සට්ඨි අසිතපීතඛායිතසායිතස්ස නිස්සන්දො, අත්ථි තස්ස ආසයො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

18. ස. පු: අරහතො අසුචි සුක්කවිස්සට්ඨි අසිතපීතඛායිතසායිතස්ස නිස්සන්දො, නත්ථි තස්ස ආසයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහතො උච්චාරපස්සාවො අසිතපීතඛායිතසායිතස්ස නිස්සන්දො, නත්ථි තස්ස ආසයො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

19. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, මෙථුනං ධම්මං උප්පාදෙය්‍ය, පුත්තසම්බාධසයනං අජ්ඣාවසෙය්‍ය, කාසිකචන්දනං පච්චනුභවෙය්‍ය, මාලාගන්ධවිලෙපනං ධාරෙය්‍ය, ජාතරූපරජතං සාදියෙය්‍යා'ති·

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

20. ස. පු: අත්ථි පුථුජ්ජනස්ස අසුචි සුක්කවිස්සට්ඨි, පුථුජ්ජනො මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, මෙථුනං ධම්මං උප්පාදෙය්‍ය, පුත්තසම්බාධසයනං අජ්ඣාවසෙය්‍ය, කාසිකචන්දනං පච්චනුභවෙය්‍ය, මාලාගන්ධවිලෙපනං ධාරෙය්‍ය, ජාතරූපරජතං සාදියෙය්‍යා'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨි, අරහා මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, මෙථුනං ධම්මං උප්පාදෙය්‍ය, පුත්තසම්බාධසයනං අජ්ඣාවසෙය්‍ය, කාසිකචන්දනං පච්චනුභවෙය්‍ය, මාලාගන්ධවිලෙපනං ධාරෙය්‍ය, ජාතරූපරජතං සාදියෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

16. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය අසිත පීත ඛායිත සායිතයන්ගේ විපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ ශුක්‍රයාගේ ආශයස්ථාන ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

17. ස. පු: රහත්හට අසිත පීත ඛායිත සායිතයන්ගේ විපාක වූ අස්පස් වෙයි. ඒ මලමූත්‍ර දෙදෙනාගේ ආශයස්ථාන ඇද්ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට අසිත පීත ඛායිත සායිතයන්ගේ විපාක වූ අශුචි ශුක්‍රවිසෘෂ්ටි වෙයි. ඒ ශුක්‍රයාගේ ආශයස්ථාන ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

18. ස පු: රහත්හට අසිත පීත ඛායිත සායිතයන්ගේ විපාක වූ අශුචි ශුක්‍රවිසෘෂ්ටි වෙයි. ඒ ශුක්‍රයාගේ ආශයස්ථාන නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට අසිත පීත ඛායිත සායිතයන්ගේ විපාක වූ අස්පස් වෙයි. ඒ මලමූත්‍ර දෙදෙනාගේ ආශයස්ථාන නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

19. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත් මෙවුන්දම් සෙවුනේ වේ ද? මෙවුන්දම් උපදවනු වේ ද, පුත්‍රසම්බාධශයනයෙහි වාස කෙරේ ද, කසීසඳුන් වළඳ කෙරේ ද, මල්ගඳ-විලෙවුන් දරා ද, රන්රිදී ඉවසා ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

20. ස පු. පුහුදුනට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇත, පුහුදුන් මෙවුන්-දම් සෙවුනේ වේ ද, මෙවුන්දම් උපදවනු වේ ද, පුත්‍රසම්බාධශයනයෙහි වාස කෙරේ ද, කසීසඳුන් වළඳ කෙරේ ද, මල්ගඳවිලෙවුන් දරා ද, රන්රිදී පිළිගනී ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇත. රහත් මෙවුන්-දම් සෙවුනේ වේ ද, මෙවුන්දම් උපදවනු වේ ද, පුත්‍රසම්බාධශයනයෙහි වාස කෙරේ ද, කසීසඳුන් වළඳ කෙරේ ද, මල්ගඳවිලෙවුන් දරා ද, රන්රිදී පිළිගනීද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

21. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨි, න ච අරහා මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, මෙථුනං ධම්මං උප්පාදෙය්‍ය, පුත්තසම්බාධසයනං අජ්ඣාවසෙය්‍ය, කාසිකචන්දනං පච්චනුභවෙය්‍ය, මාලාගන්ධවිලෙපනං ධාරෙය්‍ය, ජාතරූපරජතං සාදියෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි පුථුජ්ජනස්ස අසුචි සුක්කවිස්සට්ඨි, න ච පුථුජ්ජනො මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, මෙථුනං ධම්මං උප්පාදෙය්‍ය, පුත්තසම්බාධසයනං අජ්ඣාවසෙය්‍ය, කාසිකචන්දනං පච්චනුභවෙය්‍ය, මාලාගන්ධවිලෙපනං ධාරෙය්‍ය, ජාතරූපරජතං සාදියෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

22. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහතො රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහතො රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො,

අනු පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

23. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු. නනු අරහතො දොසො පහීනො -පෙ- මොහො පහීනො -පෙ- මානො පහීනො -පෙ- දිට්ඨි පහීනා -පෙ- විචිකිච්ඡා පහීනා -පෙ- ථීනං පහීනං -පෙ- මිද්ධං පහීනං පෙ- උද්ධච්චං පහීනං -පෙ- අහිරිකං පහීනං -පෙ- අනොත්තප්පං පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මන්ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

21. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇත, රහත් මෙවුන්දම් නො සෙවුනේ වේ ද, මෙවුන්දම් නො උපදවනු වේ ද, පුත්‍රසම්බාධශයනයෙහි වාස නො කරනු වේ ද, කසීසඳුන් වළඳ නො කරනු වේ ද, මල්ගඳවිලෙවුන් නො ධරනු වේ ද, රන්රිදී නො පිළිගනු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පුහුදුනට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇත, පුහුදුන් මෙවුන්-දම් නො සෙවුනේ වේ ද, මෙවුන්දම් නො උපදවනු වේ ද, පුත්‍රසම්බාධශයනයෙහි වාස නො කෙරේ ද, කසීසඳුන් වළඳ නො කරනු වේ ද, මල්ගඳ-විලෙවුන් නො දරනු වේ ද, රන්රිදී නො පිළිගනු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

22. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට රාගය ප්‍රහීණ නො වේ ද, උසුන්මුල් නො වේ ද, මුදුන්සුන් තලක් සෙයින් කළ අවස්තුකභාව ඇති නො වේ ද, කළ අභාව ඇති නො වේ ද, මතු නූපදනා සැහැවි ඇති නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු ඨ: ඉදින් රහත්හට රාගය ප්‍රහීණ වේ නම්, තාලවස්තු කෘත වේ නම්, අභාවකෘත වේ නම්, මතුයෙහි අනුත්පාදධර්ම වේ නම්,

අනු. පා: භවත, රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇති' යනු නො කියැයුතු මැ යැ ...

23. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට ද්වේෂය ප්‍රහීණ නො වේ ද ... මෝහය ප්‍රහීණ නො වේ ද ... මානය ප්‍රහීණ නො වේ ද ... දෘෂ්ටි ප්‍රහීණ නො වේ ද ... විචිකිත්සා ප්‍රහීණ නො වේ ද ... ස්ත්‍යාන ප්‍රහීණ නො වේ ද ... මිද්ධය ප්‍රහීණ නො වේ ද .. ඖද්ධත්‍ය ප්‍රහීණ නො වේ ද ... අහ්‍රීක ප්‍රහීණ නො වේ ද ... අනපත්‍රපා ප්‍රහීණ නො වේ ද උසුන්මුල් නො වේ ද, තාලාවස්තුකෘත නො වේ ද, අභාවකෘත නො වේ ද, මතුයෙහි අනුත්පාදධර්ම නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: හඤ්චි අරහතො අනොත්තප්පං පහීනං උච්ඡින්න-මූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

24 ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහතො රාගප්පහානාය මග්ගො භාවිතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහතො රාගප්පහානාය මග්ගො භාවිතො,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

25. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහතො රාගප්පහානාය සතිපට්ඨානා භාවිතා -පෙ- සම්මප්පධානා භාවිතා -පෙ- ඉද්ධිපාදා භාවිතා -පෙ- ඉන්ද්‍රියා භාවිතා -පෙ- බලා භාවිතා -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

අනු. ඨ: හඤ්චි අරහතො රාගප්පහානාය බොජ්ඣඞ්ගා භාවිතා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

26. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහතො දොසප්පහානාය -පෙ- මොහප්පහානාය -පෙ- අනොත්තප්පප්පහානාය -පෙ- මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහතො අනොත්තප්පප්පහානාය බොජ්ඣඞ්ගා භාවිතා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

අනු. ඨ: ඉදින් රහත්හට අනපත්‍රපා ප්‍රහීණ වේ නම්, උසුන්මුල් වේ නම්, මුදුන්සුන් තලක් සෙයින් කළ අවස්තුකභාව ඇත් නම්, පුනපුනා කළ අභාව ඇත් නම්, මතුයෙහි නූපදනා සැහැවි ඇත් නම්,

අනු. පා: භවත, 'රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇති'යි නො කියයුතු යෑ.

24. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: රහත්හු විසින් රාගප්‍රහාණය පිණිස මාර්ගය භාවිත නො වේ ද?

ප. පටිඤ්ඤා. එසේ යෑ.

අනු. ඨ: ඉදින් රහත්හු විසින් රාගප්‍රහාණය පිණිස මාර්ගය භාවිත වේ නම්,

අනු. පා: භවත, 'රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය ඇති' යනු නො කියයුතු මැ යෑ.

25. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස අනු: රහත්හට රාගප්‍රහාණය පිණිස සිවටන්හු භාවිත නො? ... සම්‍යක්ප්‍රධානයෝ භාවිත නො? ... ඍද්ධිපාදයෝ භාවිත නො? ... ඉන්ද්‍රියයෝ භාවිත නො? බල භාවිත නො? ... බොධ්‍යඞ්ගයෝ භාවිත නො?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

අනු. ඨ: ඉදින් රහත්හට රාගප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිත වෙත් නම්,

අනු. පා: භවත, 'රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇත' යනු නො කියයුතු මැ යෑ

26. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: රහත්හට ද්වෙෂප්‍රහාණය පිණිස ... මොහප්‍රහාණය පිණිස ... අනපත්‍රපාප්‍රහාණය පිණිස මාර්ගය භාවිත නො වේ ද ... බොධ්‍යඞ්ග භාවිත නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

අනු. ඨ: ඉදින් රහත්හට අනපත්‍රපාප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිත වෙත් නම්,

අනු. පා: භවත, 'රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටිය ඇත' යනු නො කියයුතු මැ යෑ.

27. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටික්ඛ: ආමන්තා.

ස. අනු: නනු අරහා වීතරාගො වීතදොසො වීතමොහො කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො උක්ඛිත්තපලිඝො සංකිණ්ණපරිඛො අබ්බුළ්හෙසිකො නිරග්ගළො අරියො පන්නද්ධජො පන්නභාරො විසඤ්ඤුත්තො සුවිජිතවිජයො, දුක්ඛං තස්ස පරිඤ්ඤාතං සමුදයො පහීනො නිරොධො සච්ඡිකතො මග්ගො භාවිතො, අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං පහාතබ්බං පහීනං භාවෙතබ්බං භාවිතං සච්ඡිකාතබ්බං සච්ඡිකතන්ති.

ප. පටික්ඛ: ආමන්තා.

අනු: ඨ: හඤ්චි අරහා වීතරාගො වීතදොසො වීතමොහො කතකරණීයො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

28. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. වි: සධම්මකුසලස්ස අරහතො අත්ථි අසුචි සුක්කවිස්සට්ඨි, පරධම්මකුසලස්ස අරහතො නත්ථි අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ස. පු: සධම්මකුසලස්ස අරහතො අත්ථි අසුචි සුක්කවිස්සට්ඨීති.

ප. පටික්ඛ: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො අත්ථි අසුචි සුක්කවිස්සට්ඨී'ති

ස පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

29. ස. පු: පරධම්මකුසලස්ස අරහතො නත්ථි අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටික්ඛ: ආමන්තා.

ස. අනු: සධම්මකුසලස්ස අරහතො නත්ථි අසුචිසුක්කවිස්සට්ඨී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

27. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත් වනාහි වීතරාග වූයේ වීතද්වෙෂ වූයේ වීතමොහ වූයේ කළ කරණී ඇතියේ බහාලූ කෙලෙස්බර ඇතියේ පැමිණි රහත්ඵල ඇතියේ පරික්ෂීණභවසංයොජන ඇතියේ මොනොවට දැන මිදී සිටියේ පෙරළු කෙලෙස් කනයම ඇතියේ විසුරුවාලූ කෙලෙස් පිරි ඇතියේ උගුළුවාලූ කෙලෙස් නමැති ඉන්ද්‍රකීල ඇතියේ අපගත කෙලශාගීල ඇතියේ ආයඪ් වූයේ හෙළු මානධ්වජ ඇතියේ ගිලිහුණු කෙලෙස්බර ඇතියේ විසංයුක්ත වූයේ මොනවට දුනු කෙලෙස්විජය ඇතියේ නො වේ ද? ඔහු විසින් දුඃඛය පරිඥත නො වේ ද? සමුදය ප්‍රහීණ නො වේද? නිරොධය සාක්ෂාත්කෘත නො වේ ද? මාර්ගය භාවිත නො වේ ද? අභිඥෙයධර්ම අභිඥත නො වේ ද? පරිඥෙයධර්ම පරිඥත නො වේ ද? ප්‍රහාතව්‍ය ධර්ම ප්‍රහීණ නො වේ ද? භාවිතව්‍යධර්ම භාවිත නො නො වේ ද? සාක්ෂාත්කර්තව්‍යධර්ම සාක්ෂාත්කෘත නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු: ඨ: ඉදින් රහත් වීතරාග වීතද්වෙෂ වීතමොහ කෘත-කරණීය වේ නම් ... (ඔහු විසින්) සාක්ෂාත්-කර්තව්‍යධර්ම සාක්ෂාත්කෘත වේ නම්,

අනු. පා: භවත, 'රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇති' යනු නො කියැයුතු මැ යැ.

28. ස. පු: රහත්හට අශුචි ශුක්‍රසෘෂ්ටි ඇද්ද?

ප. වි: සවධර්මකුශල (ප්‍රඥවිමුක්ත) වූ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇත. පරධර්මකුශල (උභතොභාග-විමුක්ත) වූ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැත.

ස. පු: සවධර්මකුශල (තමා සතු රහත්දහම් මතුයෙහි දක්ෂ) වූ රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධර්මකුශල (සිය දහමින් අන්‍ය වූ අෂ්ටසමාපත්ති ධර්මයෙහි දක්ෂ) රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

29. ස. පු: පරධර්මකුශල රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සවධර්මකුශල රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

80. ස. පු: සධම්මකුසලස්ස අරහතො රාගො පහීනො, අත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො රාගො පහීනො, අත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

81. ස. පු: සධම්මකුසලස්ස අරහතො දොසො පහීනො -පෙ- මොහො පහීනො -පෙ- අනොත්තප්පං පහීනං, අත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො අනොත්තප්පං පහීනං, අත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

82. ස. පු: සධම්මකුසලස්ස අරහතො රාගප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා -පෙ- දොසප්පහානාය -පෙ- මොහප්පහානාය -පෙ- අනොත්තප්පප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා, අත්ථි තස්ස අසුචි සුක්ක-විස්සට්ඨී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො අනොත්තප්පප්පහා-නාය බොජ්ඣඞ්ගා භාවිතා, අත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

83. ස. පු: සධම්මකුසලො අරහා වීතරාගො වීතදොසො වීතමොහො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං, අත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලො අරහා වීතරාගො වීතදොසො වීතමොහො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං, අත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

84. ස. පු: පරධම්මකුසලස්ස අරහතො රාගො පහීනො, නත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: සධම්මකුසලස්ස අරහතො රාගො පහීනො, නත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

30. ස. පු: සවධම්කුශල රහත්හට රාගය ප්‍රහීණ වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධම්කුශල රහත්හට රාගය ප්‍රහීණ වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

31. ස. පු: සවධම්කුශල රහත්හට ද්වෙෂ ප්‍රහීණ වෙයි ... මොහ ප්‍රහීණ වෙයි ... අනපත්‍රපා ප්‍රහීණ වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධම්කුශල රහත්හට අනපත්‍රපා ප්‍රහීණ වෙයි, ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

32. ස. පු. සවධම්කුශල රහත්හට රාගප්‍රහාණය පිණිස මාර්ගය භාවිත වෙයි ... බොධ්‍යඞ්ගයෝ භාවිතයහ ... ද්වෙෂප්‍රහාණය පිණිස ... මොහප්‍රහාණය පිණිස ... අනපත්‍රපාප්‍රහාණය පිණිස මාර්ගය භාවිත වෙයි ... බොධ්‍යඞ්ගයෝ භාවිතයහ, ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධම්කුශල රහත්හට අනපත්‍රපාප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

33. ස. පු: සවධම්කුශල රහත් විතරාග විතද්වෙෂ විතමොහ වෙයි ... සාක්‍ෂාත්කර්තව්‍යධම් සාක්‍ෂාත්කෘත වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධම්කුශල රහත් විතරාග විතද්වෙෂ විතමොහ වෙයි ... සාක්‍ෂාත්කර්තව්‍යධම් සාක්‍ෂාත්කෘත වෙයි ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

34. ස. පු: පරධම්කුශල රහත්හට රාගය ප්‍රහීණ වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සවධම්කුශල රහත්හට රාගප්‍රහීණ වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

35. ස. පු: පරධම්මකුසලස්ස අරහතො දොසො පහීනො -පෙ- මොහො පහීනො -පෙ- අනොත්තප්පං පහීනං, නත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සධම්මකුසලස්ස අරහතො අනොත්තප්පං පහීනං, නත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

36. ස. පු: පරධම්මකුසලස්ස අරහතො රාගප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා -පෙ- දොසප්පහානාය -පෙ- මොහප්පහානාය -පෙ- අනොත්තප්පප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා, නත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සධම්මකුසලස්ස අරහතො අනොත්තප්පප්පහානාය බොජ්ඣඞ්ගා භාවිතා, නත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

37. ස. පු: පරධම්මකුසලො අරහා වීතරාගො වීතදොසො වීතමොහො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං, නත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සධම්මකුසලො අරහා වීතරාගො වීතදොසො වීතමොහො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං, නත්ථි තස්ස අසුචි සුක්කවිස්සට්ඨී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

38. ස. පු: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "යෙ කෙචි භික්ඛවෙ භික්ඛූ පුථුජ්ජනා සීලසම්පන්නා සතා සම්පජානා නිද්දං ඔක්කමන්ති, තෙසං අසුචි න මුච්චති. යෙ’පි තෙ භික්ඛවෙ, බාහිරකා ඉසයො කාමෙසු වීතරාගා, තෙසම්පි අසුචි න මුච්චති. අට්ඨානමෙතං භික්ඛවෙ, අනවකාසො යං අරහතො අසුචි මුච්චෙය්‍යා’ති"[a] අත්ථෙ’ව සුත්තන්තොති.

---

[a] මහාවග්ගපාළියං චීවරක්ඛන්ධකෙ නිසීදනානුඤ්ඤානකථං සම්බන්ධාහරිතබ්බා.

35. ස. පු: පරධම්කුශල රහත්හට ද්වේෂය ප්‍රහීණ වෙයි ... මෝහය ප්‍රහීණ වෙයි ... අනපත්‍රපා ප්‍රහීණ වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සවධම්කුශල රහත්හට අනපත්‍රපා ප්‍රහීණ වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පු: එසේ නො කියැයුතු මැ යැ ...

36. ස. පු: පරධම්කුශල රහත්හට රාගප්‍රහාණය පිණිස මාර්ගය භාවිත වෙයි ... බොධ්‍යඞ්ගයෝ භාවිතයහ .. ද්වේෂප්‍රහාණය පිණිස .. මෝහප්‍රහයාණය පිණිස... අනපත්‍රපාප්‍රහාණය පිණිස මාර්ගය භාවිත වෙයි... බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සවධම්කුශල රහත්හට අනපත්‍රපාප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔහුට අශුචි ශුක්‍ර-විසෘෂ්ටි නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

37. ස. පු: පරධම්කුශල රහත් වීතරාග වීතද්වේෂ වීතමොහ වෙයි ... සාක්‍ෂාත්කර්තව්‍යධම් සාක්‍ෂාත්කෘත වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සවධම්කුශල රහත් වීතරාග වීතද්වේෂ වීතමොහ වෙයි ... සාක්‍ෂාත්කර්තව්‍යධම් සාක්‍ෂාත්කෘත වෙයි. ඔහුට අශුචි ශුක්‍රවිසෘෂ්ටි නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

38. ස. පු: රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, යම් මැ මහණ කෙනෙක් පුහුදුන් වූවාහු සිල් සපන් වූවාහු සිහි ඇතියාහු සම්ප්‍රඥාන ඇත්තාහු නිද්‍රාවට බැසගනිත් ද, උනට අසුචි නො මිදේ. මහණෙනි, කාමයෙහි වීතරාග වූ කාමච්ඡයෙහි පැහූ රාග ඇති යම් ඒ බාහිර සෘෂිහු වෙත් ද, උනට ද අසුචි නො මිදේ. මහණෙනි, 'රහත්හට අසුචි මිදේ' යන යම් කරුණෙක් ඇද්ද, තෙල කරුණ අස්ථාන යැ. වන්නට අවකාශ ද නැතැ''යි වදාල සූත්‍රාන්ත ඇත්තේ මැ නො වේ ද?

ප. පටික්ඛෙපො: ආමන්තා.

අනු. පා: තෙන හි න වත්තබ්බං: අත්ථි අරහතො අසුචි සුක්කවිස්සට්ඨී'ති.

39. ප. පු: න වත්තබ්බං අත්ථි අරහතො පරූපහාරො'ති.

ස. පටික්ඛෙපො: ආමන්තා.

ප. අනු: නනු අරහතො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරෙ උපසංහරෙය්‍යුන්ති.

ස. පටික්ඛෙපො: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහතො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරෙ උපසංහරෙය්‍යුං,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අත්ථි අරහතො පරූපහරො"ති.

40. ස. පු: "අරහතො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරෙ උපසංහරෙය්‍යුන්ති" අත්ථි අරහතො පරූපහාරො'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: අරහතො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා පරෙ උපසංහරෙය්‍යුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

පරූපහාරකථා නිට්ඨිතා.

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ප. එකරුණින් 'රහත්හට අශුචි ශුක්‍රවිසෘෂ්ටි ඇති, යනු නො කියැයුතු යැ.

39. ප. පු: 'රහත්හට පරෝපහාර ඇති'යි නො කියැයුතු ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රහත්හට සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකර අත්හු එළවාලත්නාහු නො වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් රහත්හට චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර අත්හු එළවා-ලත්නාහු නම්,

අනු. පා: හවත, එකරුණින් 'රහත්හට පරෝපහාර ඇති'යි කියැයුතු මැ යැ.

40. ස. පු: 'රහත්හට සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකර අනුන් එළවති'යි රහත්හට පරෝපහාර ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'රහත්හට සොවත්එල වේවයි සෙදගැමිඑල වේවයි අනගැමිඑල වේවයි රහත්බව වේවයි පරහු එළවාලත් ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

පරෝපහාරකථා නිමි.

2. 2.

අඤ්ඤාණකථා.

1. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: නත්ථි අරහතො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි නත්ථි අරහතො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණං,

අනු. පා. නො ච වත රෙ වත්තබ්බෙ "අත්ථි අරහතො අඤ්ඤාණන්ති".

3. ස. පු: අත්ථි පුථුජ්ජනස්ස අඤ්ඤාණං, අත්ථි තස්ස අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජා පරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො අඤ්ඤාණං, අත්ථි තස්ස අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණං, නත්ථි තස්ස අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි පුථුජ්ජනස්ස අඤ්ඤාණං, නත්ථි තස්ස අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. 2.

අඤ්ඤාණකථා.

[ස්ත්‍රීපුරුෂාදීන්ගේ නාමගොත්‍රාදියෙහි ඥානප්‍රවෘත්ති නැතියෙන් 'රහත්නට අඥාන ඇති'යි ගත් පූර්වශෛලීයාදී නිකායාන්තරවාසීන්ගේ ලබ්ධි බිඳුනම අඤ්ඤාණකථා එයි.]

1. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට අවිද්‍යා අවිද්‍යෞඝ අවිද්‍යායොග අවිද්‍යානුශය අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අවිද්‍යාසංයොජන අවිද්‍යානීවරණ ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

2. ස. පු: රහත්හට අවිද්‍යා අවිද්‍යෞඝ අවිද්‍යායොග, අවිද්‍යානුශය අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අවිද්‍යාසංයොජන අවිද්‍යානීවරණ නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් රහත්හට අවිද්‍යා අවිද්‍යෞඝ අවිද්‍යායොග අවිද්‍යානුශය අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අවිද්‍යාසංයොජන අවිද්‍යානීවරණ නැත් නම්,

අනු. පා: භවත, 'රහත්හට අඥාන ඇති' යනු නො කියැයුතු මැ යැ.

3. ස. පු: පුහුදුත්හට අඥාන ඇත. උහුට අවිද්‍යා අවිද්‍යෞඝ අවිද්‍යායොග අවිද්‍යානුශය අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අවිද්‍යාසංයොජන අවිද්‍යානීවරණ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට (තොප මතයෙහි) අඥාන ඇත උහුට අවිද්‍යා අවිද්‍යෞඝ අවිද්‍යායොග අවිද්‍යානුශය අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අවිද්‍යාසංයොජන අවිද්‍යානීවරණ ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

4. ස. පු: රහත්හට (තොප මතයෙහි) අඥාන ඇත. ඔහුට අවිද්‍යා අවිද්‍යෞඝ අවිද්‍යායොග අවිද්‍යානුශය අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අවිද්‍යාසංයොජන අවිද්‍යානීවරණ නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පුහුදුත්හට අඥාන ඇත. ඔහුට අවිද්‍යා අවිද්‍යෞඝ අවිද්‍යායොග අවිද්‍යානුශය අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අවිද්‍යාසංයොජන අවිද්‍යානීවරණ නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

5. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා "අඤ්ඤාණපකතො පාණං හනෙය්‍ය, අදින්නං ආදියෙය්‍ය, මුසා භණෙය්‍ය, පිසුනං භණෙය්‍ය, ඵරුසං භණෙය්‍ය, සම්ඵං පලපෙය්‍ය[1] සන්ධිං ඡින්දෙය්‍ය, නිල්ලොපං හරෙය්‍ය, එකාගාරිකං කරෙය්‍ය, පරිපන්ථෙ තිට්ඨෙය්‍ය, පරදාරං ගච්ඡෙය්‍ය, ගාමඝාතං කරෙය්‍ය, නිගමඝාතං කරෙය්‍යා"ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: අත්ථි පුථුජ්ජනස්ස අඤ්ඤාණං, පුථුජ්ජනො අඤ්ඤාණපකතො පාණං, හනෙය්‍ය අදින්නං ආදියෙය්‍ය, මුසා භණෙය්‍ය -පෙ- ගාමඝාතං කරෙය්‍ය, නිගමඝාතං කාරෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො අඤ්ඤාණං, අරහා අඤ්ඤාණපකතො පාණං හනෙය්‍ය, අදින්නං ආදියෙය්‍ය -පෙ- ගාමඝාතං කරෙය්‍ය, නිගමඝාතං කරෙය්‍යා'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණං, න ච අරහා අඤ්ඤාණපකතො පාණං හනෙය්‍ය, අදින්නං ආදියෙය්‍ය -පෙ- ගාමඝාතං කරෙය්‍ය, නිගමඝාතං කරෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි පුථුජ්ජනස්ස අඤ්ඤාණං, න ච පුථුජ්ජනො අඤ්ඤාණපකතො පාණං හනෙය්‍ය, අදින්නං ආදියෙය්‍ය -පෙ- ගාමඝාතං කරෙය්‍ය, නිගමඝාතං කරෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො සත්ථරි අඤ්ඤාණං ධම්මෙ අඤ්ඤාණං සඞ්ඝෙ අඤ්ඤාණං සික්ඛාය අඤ්ඤාණං පුබ්බන්තෙ අඤ්ඤාණං අපරන්තෙ අඤ්ඤාණං පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1 සම්ඵප්පලාපෙය්‍ය - PTS.

5. ස පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත් අඥානයෙන් උපද්‍රැත වූයේ පණ නසන්නේ වේ ද, අයිනාදන් ගන්නේ වේ ද, මුසවා බණන්නේ වේ ද, පෙහෙසුන් බණන්නේ වේ ද, පරොස්බස් බණන්නේ වේ ද, පලප් බණන්නේ වේ ද, ගෘහසන්ධි සිඳුනේ වේ ද, ගම් වොලොගන්නේ වේ ද, එකාගාරික කම් කරන්නේ වේ ද, කඩපලාසොරකම්හි සිටුනේ වේ ද, පරදුරයට යේ ද, ගාමඝාත කෙරේ ද, නිගමඝාත කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

6. ස. පු: පුහුදුනට අඥාන ඇත. පුහුදුන් අඥානයෙන් මඩනා ලදුයේ පණ නසා ද, අයිනාදන් කෙරේ ද, මුසවා බෙණේ ද ... ගාමඝාත කම් කෙරේ ද, නිගමඝාත කම් කෙරේ ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට (තොප මතයෙහි) අඥාන ඇත. රහත් අඥානයෙන් මඩනා ලදුයේ පණ නසා ද, අයිනාදන් ගනී ද . ගම්පැහැරීම් කෙරේ ද, නියම්ගම් පැහැරීම් කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

7. ස. පු: රහත්හට (තොප මතයෙහි) අඥාන ඇත. රහත් අඥායෙන් උපද්‍රැත වූයේ පණ නො නසන්නේ වේ ද, අයිනාදන් නො ගන්නේ වේ ද, ... ගම්පැහැරීම් නො කරන්නේ වේ ද, නියම්ගම් පැහැරීම් නො කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පුහුදුනට අඥාන ඇත. පුහුදුන් අඥානයෙන් උපද්‍රැත වූයේ පණ නො නසන්නේ වේ ද, අයිනාදන් නො ගන්නේ වේ ද, ... ගාමඝාතකම් නො කරන්නේ වේ ද, නිගමඝාතකම් නො කරනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

8. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට ශාස්තෲන් කෙරෙහි අඥාන ඇද්ද? දහමෙහි අඥාන ඇද්ද, සඟුන් කෙරෙහි අඥාන ඇද්ද, ශික්‍ෂායෙහි අඥාන ඇද්ද, පූර්වාන්තයෙහි අඥාන ඇද්ද, අපරාන්තයෙහි අඥාන ඇද්ද, පූර්වාන්තාපරාන්තයෙහි අඥාන ඇද්ද, ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෙහි අඥාන ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

9. ස. පු: නත්ථි අරහතො සත්ථරි අඤ්ඤාණං, ධම්මෙ අඤ්ඤාණං, සඞ්ඝෙ අඤ්ඤාණං, සික්ඛාය අඤ්ඤාණං, පුබ්බන්තෙ අඤ්ඤාණං, අපරන්තෙ අඤ්ඤාණං, පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ථෙ: හඤ්චි නත්ථි අරහතො සත්ථරි අඤ්ඤාණං, ධම්මෙ අඤ්ඤාණං, සඞ්ඝෙ අඤ්ඤාණං -පෙ- ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

10. ස. පු: අත්ථි පුථුජ්ජනස්ස අඤ්ඤාණං, අත්ථි තස්ස සත්ථරි අඤ්ඤාණං, ධම්මෙ අඤ්ඤාණං, සඞ්ඝෙ අඤ්ඤාණං, -පෙ- ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො අඤ්ඤාණං, අත්ථි තස්ස සත්ථරි අඤ්ඤාණං, ධම්මෙ අඤ්ඤාණං, සඞ්ඝෙ අඤ්ඤාණං, -පෙ- ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණං, නත්ථි තස්ස සත්ථරි අඤ්ඤාණං, ධම්මෙ අඤ්ඤාණං, සඞ්ඝෙ අඤ්ඤාණං, -පෙ- ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි පුථුජ්ජනස්ස අඤ්ඤාණං, නත්ථි තස්ස සත්ථරි අඤ්ඤාණං, ධම්මෙ අඤ්ඤාණං, සඞ්ඝෙ අඤ්ඤාණං, -පෙ- ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහතො රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො’ති.

9. ස. පු: රහත්හට ශාස්තෘන් කෙරෙහි අඥාන නැද්ද? දහමෙහි අඥාන නැද්ද, සඟුන් කෙරෙහි අඥාන නැද්ද, ශික්ෂායෙහි අඥාන නැද්ද, පූර්වාන්තයෙහි අඥාන නැද්ද, අපරාන්තයෙහි අඥාන නැද්ද, පූර්වාන්තාපරාන්තයෙහි අඥාන නැද්ද, ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෙහි අඥාන නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් රහත්හට ශාස්තෘන් කෙරෙහි අඥාන නැත් නම්, දහමෙහි අඥාන නැත් නම්, සඟුන් කෙරෙහි අඥාන නැත් නම් ... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෙහි අඥාන නැත් නම්,

අනු. පා: හවත, 'රහත්හට අඥාන ඇති'යි නො කියැයුතු මැ යැ.

10 ස. පු: පුහුදුනට අඥාන ඇත. උහුට ශාස්තෘන් කෙරෙහි අඥාන ඇද්ද, දහමෙහි අඥාන ඇද්ද, සඟුන් කෙරෙහි අඥාන ඇද්ද ... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයෙහි අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට (තොප මතයෙහි) අඥාන ඇත. ඔහුට ශාස්තෘන් කෙරෙහි අඥාන ඇද්ද, දහමෙහි අඥාන ඇද්ද, සඟුන් කෙරෙහි අඥාන ඇද්ද ... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෙහි අඥාන ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

11. ස. පු: රහත්හට (තොප මතයෙහි) අඥාන ඇත. ඔහුට ශාස්තෘන් කෙරෙහි අඥාන නැද්ද, දහමෙහි අඥාන නැද්ද, සඟුන් කෙරෙහි අඥාන නැද්ද .... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෙහි අඥාන නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පුහුදුනට අඥාන ඇත. ඔහුට ශාස්තෘන් කෙරෙහි අඥාන නැද්ද, දහමෙහි අඥාන නැද්ද, සඟුන් කෙරෙහි අඥාන නැද්ද ... ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයෙහි අඥාන නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

12. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට රාගය ප්‍රහීණ නො වේ ද? උසුන්මුල් ඇතියේ මුදුන්සුන් තලක් මෙන් අවස්තුක කරන ලද්දේ අනුඅභාවය කරන ලද්දේ මතුයෙහි නූපදනාසැහැවි ඇතියේ නො වේ ද?

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහතො රාගො පහීනො උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

13. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහතො දොසො පහීනො -පෙ- මොහො පහීනො -පෙ- අනොත්තප්පං පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහතො අනොත්තප්පං පහීනං උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

14. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහතො රාගප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහතො රාගප්පහානාය බොජ්ඣඞ්ගා භාවිතා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

15. ස පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහතො දොසප්පහානාය -පෙ- මොහප්පහානාය -පෙ- අනොත්තප්පප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා·

අනු. ඨ: හඤ්චි අරහතො අනොත්තප්පප්පහානාය බොජ්ඣඞ්ගා භාවිතා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා:	එසේ යැ.
අනු. ඨ:	ඉදින් රහත්හට රාගය ප්‍රහීණ වී නම් උසුත්මුල් ඇතියේ නම් මුදුන්සුන් තලක් සෙයින් අවත්ථුකෘත නම් අනුඅභාවය කරනලද නම් මතුයෙහි නූපදනා-සැහැවි ඇති වී නම්,
අනු. පා:	භවත, 'රහත්හට අඤ්ඤාණ ඇති'යි නො කියැයුතු මැ යැ.
13. ස. පු:	රහත්හට අඤ්ඤාණ ඇද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස අනු:	රහත්හට ද්වේෂය ප්‍රහීණ නො වේ ද ... මෝහය ප්‍රහීණ නො වේ ද ... අනපත්‍රපා ප්‍රහීණ නො වේ ද, උසුත්මුල් ඇතියේ තාලාවත්ථුකෘත අනභාවකෘත මතුයෙහි නූපදනා සැහැවි ඇතියේ නො වේ ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
අනු. ඨ:	ඉදින් රහත්හට අනපත්‍රපා ප්‍රහීණ වී නම් උසුත්මුල් ඇති වී නම් තාලාවත්ථුකෘත වී නම් අනුඅභාවය කරනලද වී නම් මතුයෙහි නූපදනා-සැහැවි ඇති වී නම්,
අනු. පා:	භවත, 'රහත්හට අඤ්ඤාණ ඇති'යි නො කියැයුතු මැ යැ.
14. ස. පු:	රහත්හට අඤ්ඤාණ ඇද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	රහත්හු විසින් රාගප්‍රහාණය පිණිස මාර්ගය භාවිත නො වේ ද ... බොධ්‍යඞ්ගයෝ භාවිත නො වේ ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
අනු. ඨ.	ඉදින් රහත්හු විසින් රාගප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිත වූවාහු නම්,
අනු. පා:	භවත, 'රහත්හට අඤ්ඤාණ ඇති'යි නො කියැයුතු මැ යැ.
15. ස. පු:	රහත්හට අඤ්ඤාණ ඇද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	රහත්හු විසින් ද්වේෂප්‍රහාණය පිණිස ... මෝහ-ප්‍රහාණය පිණිස ... අනපත්‍රපාප්‍රහාණය පිණිස මාර්ගය භාවිත නො වේ ද ... බොධ්‍යඞ්ගයෝ භාවිත නො?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
අනු. ඨ:	ඉදින් රහත්හු විසින් අනපත්‍රපාප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිත වූවාහු නම්,
අනු. ඨ:	භවත, 'රහත්හට අඤ්ඤාණ ඇති'යි නො කියැයුතු මැ යැ.

16. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහා වීතරාගො වීතදොසො වීතමොහො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහා වීතරාගො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

17. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. වි: සධම්මකුසලස්ස අරහතො අත්ථි අඤ්ඤාණං, පරධම්මකුසලස්ස අරහතො නත්ථි අඤ්ඤාණන්ති.

ස. පු. සධම්මකුසලස්ස අරහතො අත්ථි අඤ්ඤාණන්ති

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො අත්ථි අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

18. ස. පු සධම්මකුසලස්ස අරහතො රාගො පහීනො. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො රාගො පහීනො. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: න හෙවං වත්තබ්බෙ -පෙ-

19. ස. පු: සධම්මකුසලස්ස අරහතො දොසො පහීනො. -පෙ- මොහො පහීනො -පෙ- අනොත්තප්පං පහීනං. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො අනොත්තප්පං පහීනං. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

20. ස. පු: සධම්මකුසලස්ස අරහතො රාගප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො රාගප්පහානාය බොජ්ඣඞ්ගා භාවිතා. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

16. ස. පු: රහත්හට අඤ්ඤාණ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත් වීතරාග වීතදෝෂ වීතමෝහ නො වේ ද ... සාක්ෂාත් කර්තව්‍යය සාක්ෂාත්කෘත නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් රහත් වීතරාග ... සාක්ෂාත්කර්තව්‍ය සාක්ෂාත්කෘත වී නම්,

අනු. පා: භවත, 'රහත්හට අඥාන ඇති'යි නො කියයුතු මැ යැ.

17. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. වි: ස්වධර්මකුශල රහත්හට අඥාන ඇත, පරධර්මකුශල රහත්හට අඥාන නැති.

ස. පු: ස්වධර්මකුශල රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධර්මකුශල රහත්හට අඥාන ඇද්ද?

ප. පටි: එසේ නො කියයුතු මැ යැ ...

18. ස. පු: ස්වධර්මකුශල රහත්හට රාගය ප්‍රහීණ යැ. ඔහට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධර්මකුශල රහත්හට රාගය ප්‍රහීණ යැ. ඔහට අඥාන ඇද්ද?

ප. පටි: එසේ නො කියයුතු මැ යැ ...

19. ස. පු: ස්වධර්මකුශල රහත්හට දෝෂය ප්‍රහීණ යැ .... මෝහය ප්‍රහීණ යැ ... අනපත්‍රපා ප්‍රහීණ යැ. ඔහට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධර්මකුශල රහත්හට අනපත්‍රපා ප්‍රහීණ යැ. ඔහට අඥාන ඇද්ද?

ප. පටි: එසේ නො කියයුතු මැ යැ ...

20. ස. පු: ස්වධර්මකුශල රහත්හු විසින් රාගප්‍රහාණය පිණිස මාර්ගය භාවිත යැ ... බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔබට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පරධර්මකුශල රහත්හු විසින් රාගප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔහට අඥාන ඇද්ද?

ප. පටි: එසේ නො කියයුතු මැ යැ ...

21\. ස. පු: සධම්මකුසලස්ස අරහතො දොසප්පහානාය -පෙ- මොහප්පහානාය -පෙ- අනොත්තප්පප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලස්ස අරහතො අනොත්තප්පප්පහානාය බොජ්ඣඞ්ගා භාවිතා. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

22\. ස. පු: සධම්මකුසලො අරහා වීතරාගො වීතදොසො වීතමොහො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරධම්මකුසලො අරහා වීතරාගො වීතදොසො වීතමොහො පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං. අත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

23\. ස. පු: පරධම්මකුසලස්ස අරහතො රාගො පහීනො. නත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සධම්මකුසලස්ස අරහතො රාගො පහීනො. නත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

24\. ස. පු: පරධම්මකුසලස්ස අරහතො දොසො පහීනො -පෙ- මොහො පහීනො -පෙ- අනොත්තප්පං පහීනං. නත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සධම්මකුසලස්ස අරහතො අනොත්තප්පං පහීනං. නත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

25\. ස පු: පරධම්මකුසලස්ස අරහතො රාගප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා -පෙ- දොසප්පහානාය -පෙ- මොහප්පහානාය -පෙ- අනොත්තප්පප්පහානාය මග්ගො භාවිතො -පෙ- බොජ්ඣඞ්ගා භාවිතා නත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: සධම්මකුසලස්ස අරහතො අනොත්තප්පප්පහානාය බොජ්ඣඞ්ගා භාවිතා නත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

21. ස. පු:	සවධම්කුශල රහත්හට ද්වේෂප්‍රහාණය පිණිස ... මොහප්‍රහාණය පිණිස ... අනපත්‍රපාප්‍රහාණය පිණිස මාර්ගය භාවිත යැ ... බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔහට අඥාන ඇද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	පරධම්කුශල රහත්හට අනපත්‍රපාප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔහට අඥාන ඇද්ද?
ප. පටි:	එසේ නො කියැයුතු මැ යැ ...
22. ස. පු:	සවධම්කුශල රහත් වීතරාග යැ, වීතද්වේෂ යැ, වීතමොහ යැ ... සාක්ෂාත්කතීව්‍යය සාක්ෂාත්-කෘත යි. ඔහට අඥාන ඇද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	පරධම්කුශල රහත් වීතරාග වීතද්වේෂ වීතමොහ වෙයි ... සාක්ෂාත්කතීව්‍යය සාක්ෂාත්කෘත වෙයි. ඔහට අඥාන ඇද්ද?
ප. පටි:	එසේ නො කියැයුතු මැ යැ ...
23. ස. පු:	පරධම්කුශල රහත්හට රාගය ප්‍රහීණ යැ. ඔහට අඥාන නැද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	සවධම්කුශල රහත්හට රාගය ප්‍රහීණ යැ. ඔහට අඥාන නැද්ද?
ප. පටි:	එසේ නො කියැයුතු මැ යැ ...
24. ස. පු:	පරධම්කුශල රහත්හට ද්වේෂය ප්‍රහීණ යැ ... මොහය ප්‍රහීණ යැ ... අනපත්‍රපා ප්‍රහීණ යැ. ඔහට අඥාන නැද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	සවධම්කුශල රහත්හට අනපත්‍රපා ප්‍රහීණ යැ ඔහට අඥාන නැද්ද?
ප. පටි:	එසේ නො කියැයුතු මැ යැ ...
25. ස. පු:	පරධම්කුශල රහත්හු විසින් රාගප්‍රහාණය පිණිස මාර්ගය භාවිත යැ ... බොධ්‍යඞ්ගයෝ භාවිතයහ ... ද්වේෂප්‍රහාණය පිණිස ... මොහප්‍රහාණය පිණිස අනපත්‍රපාප්‍රහාණය පිණිස මාර්ගය භාවිත යැ ... බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔහුට අඥාන නැද්ද?
ප. පටිඤ්ඤා:	එසේ යැ.
ස. අනු:	සවධම්කුශල රහත්හු විසින් අනපත්‍රපාප්‍රහාණය පිණිස බොධ්‍යඞ්ගයෝ භාවිතයහ. ඔහට අඥාන නැද්ද?
ප. පටි:	එසේ නො කියැයුතු මැ යැ ...

26. ස. පු: පරධම්මකුසලො අරහා වීතරාගො වීතදොසො වීතමොහො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං. නත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සධම්මකුසලො අරහා වීතරාගො වීතදොසො වීතමොහො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකතං. නත්ථි තස්ස අඤ්ඤාණන්ති.

ප. පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

27. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "ජානතො'හං[1] භික්ඛවෙ, පස්සතො ආසවානං ඛයං වදාමි. නො අජානතො නො අපස්සතො. කිඤ්ච භික්ඛවෙ, ජානතො කිං පස්සතො ආසවානං ඛයො හොති: "ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො, ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සඞ්ඛාරා -පෙ- ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමො'ති. එවං ඛො භික්ඛවෙ ජානතො එවං පස්සතො ආසවානං ඛයො හොති"ති.[a] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. පා: තෙන හි න වත්තබ්බං: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

28. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "ජානතො'හං[1] භික්ඛවෙ පස්සතො ආසවානං ඛයං වදාමි. නො අජානතො නො අපස්සතො. කිඤ්ච භික්ඛවෙ ජානතො කිං පස්සතො ආසවානං ඛයො හොති: ඉදං දුක්ඛන්ති භික්ඛවෙ ජානතො පස්සතො ආසවානං ඛයො හොති. අයං දුක්ඛසමුදයො'ති ජානතො පස්සතො ආසවානං ඛයො හොති. අයං දුක්ඛනිරොධො'ති ජානතො පස්සතො ආසවානං ඛයො හොති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා'ති ජානතො පස්සතො ආසවානං ඛයො හොති.

1 ජානතහං - සිමු. ජානතචාහං - PTS
a ඛන්ධසංයුත්ත - පුප්ඵවග්ග - වාසිජටසුත්ත.

26. ස. පු: පරධම්කුශල රහත් වීතරාග වීතද්වේෂ වීතමෝහ වෙයි ... සාක්‍ෂාත්කර්තව්‍යය සාක්‍ෂාත්කෘත යැ. ඔහට අඥාන නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සවධම්කුශල රහත් වීතරාග වීතද්වේෂ වීතමෝහ වෙයි ... සාක්‍ෂාත්කර්තව්‍යය සාක්‍ෂාත්කෘත යැ. ඔහට අඥාන නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

27. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, මම නුවණින් දන්නාහට දක්නාහට ආශ්‍රවක්‍ෂය කියමි. නො දන්නාහට නො දක්නාහට නො කියමි. මහණෙනි, කුමක් දන්නාහට කුමක් දක්නාහට ආශ්‍රවක්‍ෂය වේ ද යත්: රූප මෙසේ යැ, රූපසමුදය මෙසේ යැ, රූපයාගේ අස්තඞ්ගම මෙසේ යැ, වේදනා මෙසේ යැ ... සංඥ මෙසේ යැ ... සංස්කාර මෙසේ යැ ... විඥාන මෙසේ යැ, විඥානසමුදය මෙසේ යැ, විඥානයාගේ අස්තඞ්ගම මෙසේ ය යි, මහණෙනි, මෙසේ දන්නාහට මෙසේ දක්නාහට ආශ්‍රවක්‍ෂය වෙති"යි වදළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. පා: එකරුණින් 'රහත්හට අඥාන ඇති'යි නො කියැයුතු මැ යැ.

28. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නො: "මහණෙනි, මම දන්නාහට දක්නාහට ආශ්‍රවක්‍ෂය කියමි. නො දන්නාහට නො දක්නාහට නො කියමි. මහණෙනි, කුමක් දන්නාහට කුමක් දක්නාහට ආශ්‍රවක්‍ෂය වේ ද යත්: මහණෙනි, දුක මේ යයි දන්නාහට දක්නාහට ආශ්‍රවක්‍ෂය වෙයි. දුඃඛසමුදය මේ යයි දන්නාහට දක්නාහට ආශ්‍රවක්‍ෂය වෙයි. දුඃඛනිරෝධ මේ යයි දන්නාහට දක්නාහට ආශ්‍රවක්‍ෂය වෙයි. දුඃඛනිරෝධගාමිනී-ප්‍රතිපත් මේ යයි දන්නාහට දක්නාහට ආශ්‍රවක්‍ෂය වෙයි.

එවං ඛො භික්ඛවෙ ජානතො එවං පස්සතො ආසවානං ඛයො හොතී'තිa අත්ථෙව සුත්තන්තො''ති.

ප. පටිඤ්ඤු: ආමන්තා.

අනු. පා: තෙන හි න වත්තබ්බං: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

29. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤු: ආමන්තා.

ස. අනු: තත්ථ වුත්තං භගවතා: ''සබ්බං භික්ඛවෙ අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය -පෙ- ඉදං ඛො භික්ඛවෙ.[1] අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය''තිb අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤු: ආමන්තා.

අනු. පා: තෙන හි න වත්තබ්බං: අත්ථි අරහරතො අඤ්ඤාණන්ති.

30. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤු: ආමන්තා.

ස. අනු: තත්ථ වුත්තං භගවතා:

''සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති:
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වා'පි යදත්ථි කිඤ්චි,
චතූහපායෙහි ච විප්පමුත්තො,
ඡච්චාභිඨානානි අභබ්බො කාතුන්ති.''c

අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤු: ආමන්තා.

අනු. පා: තෙන හි න වත්තබ්බං: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

31. ස. පු: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤු: ආමන්තා.

---

1. සබ්බං ච ඛො භික්ඛවෙ - මජසං..
a සච්චසංයුත්ත - ආසවක්ඛයසුත්ත.
b සළායතනසංයුත්ත - අපරිජානනසුත්ත.
c සුත්තනිපාත - රතනසුත්ත.

මහණෙනි, මෙසේ දන්නාහට මෙසේ දක්නාහට ආස්‍රවක්ෂය වෙති''යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. පා: එකරුණින් 'රහත්හට අඥාන ඇති' යි නො කියැයුතු මැ යැ.

29. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු: "මහණෙනි, හැම නුවණින් නො දන්නේ වෙසෙසින් නො දන්නේ විරාග විසින් නො පියන්නේ නුවණින් නො දුරු කරන්නේ දුඃඛක්ෂය පිණිස අභව්‍ය වෙයි. මහණෙනි, මේ හැම නුවණින් දන්නේ වෙසෙසින් දන්නේ විරාග විසින් පියන්නේ දුරුකරන්නේ දුඃඛක්ෂය පිණිස භව්‍ය වෙති''යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. පා: එකරුණින් 'රහත්හට අඥාන ඇති'යි නො කියැයුතු මැ යැ.

30. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වරදානලද මැ නු "ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාණේ දර්‍ශනසම්පත් (සෝවත් මගනුවණ) පහළ වන්නා හා මැ ධර්‍මයෝ තුන් දෙනෙක් ප්‍රහීණ වූවාහු වෙත්: සත්කායදෘෂ්ටිය, විචිකිත්සාය, යම් මැ ශීලව්‍රතයෙක් හෝ ඇද්ද, මොහු යි. සතර අපායයෙන්ද විප්‍රමුක්ත වූයේ, (පඤ්චානන්තර්‍ය්‍ය, මිථ්‍යාදෘෂ්ටි යන) ෂට් අභිස්ථාන– (මහාසාවද්‍යකර්‍ම) යනුදු කරන්නට අභව්‍ය වෙති''යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. පා: එකරුණින් 'රහත්හට අඥාන ඇති'යි නො කියැයුතු මැ යැ.

31. ස. පු: රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු වුත්තං භගවතා: "යස්මිං භික්ඛවෙ සමයෙ අරියසාවකස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති, සහ දස්සනුප්පාදා භික්ඛවෙ අරියසාවකස්ස තීණි සඤ්ඤොජනානි පහීයන්ති: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො"ති. අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. පා: තෙන හි න වත්තබ්බං: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

32. ප. පු: න වත්තබ්බං: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු අරහා ඉත්ථිපුරිසානං නාමගොත්තං න ජානෙය්‍ය, මග්ගාමග්ගං න ජානෙය්‍ය, තිණකට්ඨවනප්පතීනං නාමං න ජානෙය්‍යා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරහා ඉත්ථිපුරිසානං නාමගොත්තං න ජානෙය්‍ය, මග්ගාමග්ගං න ජානෙය්‍ය, තිණකට්ඨවනප්පතීනං නාමං න ජානෙය්‍ය,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ: අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

33. ස. පු: "අරහා ඉත්ථිපුරිසානං නාමගොත්තං න ජානෙය්‍ය, මග්ගාමග්ගං න ජානෙය්‍ය, තිණකට්ඨවනප්පතීනං නාමං න ජානෙය්‍යා"ති අත්ථි අරහතො අඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා න ජානෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

අඤ්ඤාණකථා නිට්ඨිතා.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදරනලද මැ නු: "මහණෙනි, යම් කලෙක ආර්‍යශ්‍රාවකයාහට රාගාදි රජස් රහිත පැහැ මල ඇති ධර්මචක්ෂුස පහළ වී ද: 'යම් මැ සමුදයධර්මයෙක් වේ නම් එ හැම නිරෝධස්වභාව වෙති'යි. මහණෙනි, ඒ දර්ශනොත්පත්ති හා මැ ආර්‍යශ්‍රාවකයාහට සත්කාය-දෘෂ්ටි, විචිකිත්සා, ශීලව්‍රතපරාමර්ශ යන ත්‍රිවිධ සංයොජනයෝ ප්‍රහීණ වෙති"යි වදළ සූත්‍රාන්ත-යෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. පා: එකරුණින් 'රහත්හට අඥාන ඇති'යි නො කියැයුතු මැ යැ.

32. ප. පු: 'රහත්හට අඥාන ඇති'යි නො කියැයුතු ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රහත් වනාහි සත්පුරුෂයන්ගේ නාමගොත්‍ර නො දන්නේ නො? මාර්ගාමාර්ග නො දන්නේ නො? තෘණකාෂ්ඨවනස්පතීන්ගේ නම් නො දන්නේ නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් රහත් වනාහි සත්පුරුෂයන්ගේ නම්ගොත් නො දන්නේ වේ නම්, මඟ නො මඟ නො දන්නේ වේ නම්, තෘණකාෂ්ඨ වනස්පතීන්ගේ නම් නො දන්නේ වේ නම්,

අනු. පා: භවත, එකරුණින් 'රහත්හට අඥාන ඇති'යි කියැයුතු මැ යැ.

33. ස. පු: රහත් වනාහි සත්පුරුෂයන්ගේ නම්ගොත් නො දන්නේ යැ, මඟ නො මඟ නො දන්නේ යැ, තෘණකාෂ්ඨවනස්පතීන්ගේ නම් නො දන්නේ යැයි ගෙන රහත්හට අඥාන ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත් සොවත්ඵල හෝ සෙදගැමිඵල හෝ අනා-ගැමිඵල හෝ රහත්ඵල හෝ නො දන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැතු මැ යැ ...

අඤ්ඤාණකථා නිමි.

2. 3

කඞ්ඛාකථා

1. ස. පු: අත්ථි අරහතො කඞ්ඛා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො විචිකිච්ඡා, විචිකිච්ඡාපරියුට්ඨානං, විචිකිච්ඡාසඤ්ඤොජනං, විචිකිච්ඡානීවරණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: නත්ථි අරහතො විචිකිච්ඡා, විචිකිච්ඡාපරියුට්ඨානං, විචිකිච්ඡාසඤ්ඤොජනං, විචිකිච්ඡානීව· ණන්ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි නත්ථි අරහතො විචිකිච්ඡා, විචිකිච්ඡාපරියුට්ඨානං, විචිකිච්ඡාසඤ්ඤොජනං, විචිකිච්ඡානීවරණං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අත්ථි අරහතො කඞ්ඛා"ති.

3. ස. පු: අත්ථි පුථුජ්ජනස්ස කඞ්ඛා, අත්ථි තස්ස විචිකිච්ඡා, විචිකිච්ඡාපරියුට්ඨානං, විචිකිච්ඡා සඤ්ඤොජනං, විචිකිච්ඡානීවරණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි අරහතො කඞ්ඛා, අත්ථි තස්ස විචිකිච්ඡා, විචිකිච්ඡාපරියුට්ඨානං, විචිකිච්ඡාසඤ්ඤොජනං, විචිකිච්ඡානීවරණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: අත්ථි අරහතො කඞ්ඛා. නත්ථි තස්ස විචිකිච්ඡා, විචිකිච්ඡාපරියුට්ඨානං, විචිකිච්ඡාසඤ්ඤොජනං, විචිකිච්ඡානීවරණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි පුථුජ්ජනස්ස කඞ්ඛා. නත්ථි තස්ස විචිකිච්ඡා, විචිකිච්ඡාපරියුට්ඨානං, විචිකිච්ඡාසඤ්ඤොජනං, විචිකිච්ඡානීවරණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. 3.

කඞ්ඛාකථා

[අඤ්ඤාණකථායෙහි නිදානය මෙනි.]

1. ස. පු: රහත්හට සැක ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට විචිකිත්සා ඇද්ද? විචිකිත්සාපර්‍යුත්ථාන විචිකිත්සා සංයොජන විචිකිත්සානීවරණ ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

2. ස. පු: රහත්හට විචිකිත්සා නැද්ද? විචිකිත්සාපර්‍යුත්ථාන විචිකිත්සා සංයොජන විචිකිත්සානීවරණ නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් රහත්හට විචිකිත්සා නැත්නම් විචිකිත්සා-පර්‍යුත්ථාන විචිකිත්සාසංයොජන විචිකිත්සානීවරණ නැත් නම්,

අනු. පා: භවත, 'රහත්හට සැක ඇති'යි නො කියැයුතු මැ යැ.

3. ස. පු: පුහුදුන්හට සැක ඇද්ද? ඔහුට විචිකිත්සා ඇද්ද? විචිකිත්සාපර්‍යුත්ථාන විචිකිත්සාසංයොජන විචි-කිත්සානීවරණ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට සැක (තොප මතයෙහි) ඇත. ඔහුට විචිකිත්සා ඇද්ද? විචිකිත්සාපර්‍යුත්ථාන විචිකිත්සා-සංයොජන විචිකිත්සානීවරණ ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු මැ යැ ...

4. ස. පු: රහත්හට සැක ඇද්ද? ඔහුට විචිකිත්සා නැද්ද? විචිකිත්සාපර්‍යුත්ථාන, විචිකිත්සාසංයොජනා විචි-කිත්සානීවරණ නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

